# කිරි පිටි මිත්‍යාව
# කිරි ආහාර සම්බන්ධ ගැටලු හා විසඳුමට මගක්




ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය (සංස්ථාපිත)
இலங்கை பசுமை இயக்கம் (கூட்டிணைக்கப்பட்டது)
The Green Movement of Sri Lanka Inc.

## පිවිසුම

ක්ෂීරපායි සත්ත්වයෝ යනු කිරි බී වැඩෙන සත්ත්වයෝ වෙති. සොබාදහමට අනුව ඔවුන්ට කිරි නිර්මාණය වී ඇත්තේ ඒ ඒ ක්ෂීරපායි ජීවී විශේෂවල පැටවුන්ගේ වර්ධනය සඳහාමය. ඒ අනුව ගවකිරි ගව පැටවුන් සඳහා යෝග්‍ය වන අතර එළුකිරි එළු පැටවුන්ට පමණක් යෝග්‍ය වේ. එසේම, ළදරු අවධිය ගෙවා වැඩුණු පසුව වෙනත් සතුන්ගේ කිරි පානය කරන එකම සත්ත්වයා වන්නේ මිනිසාය.

කිරි සඳහා ලෝකයේ පවත්නා අධික ඉල්ලුම හේතුවෙන් අද වන විට, කිරිපිටි උදෙසා සිදුකරන ගව පාලන කර්මාන්තය ලෝකයේ විශාලතම කර්මාන්තයක් වී තිබේ. මේ කර්මාන්තය, වැඩි වශයෙන් බහුජාතික සමාගම් මගින් පාලනය කරනු ලබන අතර, ඊට ඇතැම්වෛද්‍යවරුන් හා පෝෂණවේදීන්ගේ සහාය හා ප්‍රචාරණයද ලැබේ. මේ ව්‍යාපාරයේ ප්‍රතිඵලයක් ලෙස සෞඛ්‍යය හා ආර්ථික වශයෙන් විවිධ ආදීනවවලට මුහුණ දීමට දිගු කලක සිට අපට සිදුවී තිබේ.

කිරිපිටි හා සම්බන්ධව අපට ඉතා මෑතකදී මුහුණදීමට සිදු වූ අහිතකර තත්ත්වය වන්නේ නවසීලන්තයෙන් මෙරටට ආනයනය කරනු ලබන කිරිපිටි වර්ග කිහිපයක DCDනැමැති විෂ රසායනික ද්‍රව්‍යය අඩංගු වීමය. මුලදී මේ බව ප්‍රතික්ෂේප කළද, අදාළ කිරිපිටි ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන සමාගම පසුව මේ බව පිළිගත්තේය. මේ සිදුවීම ශ්‍රී ලංකාවේ කිරිපිටි වෙළෙඳපොළේ මහත් ආන්දෝලනයකටද තුඩු දුන්නේය.

මීට පෙර 2008 වසරේදීද ප්‍රෝටීන්වල ගුණාත්මක බව වැඩිකර පෙන්වන 'මෙලමයින්' නැමැති විෂ රසායනිකය පිටිකිරි නිෂ්පාදනවල අඩංගුවීම නිසා ඇති වූ ආන්දෝලනයෙන් කිරිපිටි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන සිදුකරන සමාගම් පාරිභෝගික උදහසට ලක් විය.

එසේම DCDඅවදානම පහවීයාමටද පෙර නවසීලන්තයෙන් ආනයනය කරනු ලබන ඇතැම් කිරිපිටි නිෂ්පාදනවල *Clostridium botulinum* නම් වූ බැක්ටීරියා විශේෂයක් අඩංගු වීම පිළිබඳව මතු වූ සැකය නිසාද ශ්‍රීලංකාවේ කිරිපිටි වෙළෙඳපොළ මහත් අභියෝගයකට ලක්වී තිබේ.

මේ තත්ත්වය හමුවේ කිරි ආහාර හා ඒවායේ ගුණාත්මකභාවය පිළිබඳව කිසියම් විමසීමක් සිදු කිරීම කාලීන වැදගත්කමකින් යුක්තය. මෙහිදී හඳුනාගත හැකි වැදගත් කරුණු තුනක් අපේ අවධානයට ලක් වේ.

- **පෝෂක පදාර්ථ ලබාගැනීම සඳහා කිරි ආහාරවල ඇති වැදගත්කම හා සීමා අවබෝධ කරගැනීම -** කිරි හෝ කිරිපිටිපානය කිරීම පෝෂණය සඳහා අත්‍යවශ්‍ය වන බව සමාජගත වී ඇති මතයකි. ඒ පිළිබඳව වඩා විද්‍යාත්මකව විමසා බැලීම අවශ්‍යය. විශේෂයෙන් ළදරු කාලයෙන් පසු අප කිරිපිටි හෝ දියර කිරි පානය කරනු ලැබුවද, එහි අඩංගු පෝෂ්‍යදායක සංඝටක අතරින් රැසක් අපේ ශරීරයට ජීර්ණය නොවේ. කිරිවලින් වැඩිහිටියන්ට ලැබෙන බොහෝ පෝෂක වෙනත් ආහාර ද්‍රව්‍ය මගින් අපට ලබා ගත හැකි නිසා කිරි වෙනුවට යොදාගත හැකි වෙනත් විකල්ප ආහාර සහිත සමබර ආහාර වේලක් වෙත යොමුවීම සුදුසුය. කෙසේ වෙතත්, කිරි අත්‍යවශ්‍ය ආහාරයක් නොවන නමුත් වර්තමාන සමාජයේ ආහාර පුරුදු අනුව කිරි හා කිරි ආශ්‍රිත ආහාර ඉතා සුලභව භාවිත වේ.

- **ආනයනික කිරි ආහාර වෙනුවට දේශීය කිරි ආහාර පරිභෝජනය වැදගත් බව -** කිරි පිළිබඳව ඇති වී තිබෙන ගැටලු සඳහා වැඩි වශයෙන් හේතු වී ඇත්තේ අපේ රටට විදේශීය රටවලින් ආනයනය කරන කිරිපිටි හා කිරි ආහාරය. මේ නිසා ඒ වෙනුවට දේශීයව නිෂ්පාදිත කිරි ආහාර වෙත යොමුවීම පිළිබඳව අපේ අවධානය යොමුවෙමින් පවතී. ආනයනික කිරි ආහාර වෙනුවට අපේ කිරි ආහාර අවශ්‍යතාව සඳහා දේශීය කිරි නිෂ්පාදන භාවිත කිරීමෙන් රටේ ආර්ථිකයටද ඵලදායී වේ. එහෙත් ඒ සඳහා ක්‍රමානුකූල වැඩපිළිවෙලක් සකස් කිරීම කාලීන වේ.

- **කිරිපිටි වෙනුවට දියර කිරි භාවිත කිරීම ප්‍රවර්ධනය වැදගත්ය -** ලෝකයේ ප්‍රධාන කිරිපිටි සමාගම් පිහිටා ඇති රටවල හා දියුණු රටවල ජනතාව මෙන්ම දියුණුවන රටවල් ගණනාවක ජනතාවද වැඩි වශයෙන් පරිභෝජනය කරනු ලබන්නේ දියර කිරිය. මේ නිසා ජාතික ප්‍රතිපත්තිය ලෙස පිළිගෙන ඇති දියර කිරි භාවිත කිරීම මෙරට ජනතාව අතර තවදුරටත් ප්‍රවර්ධනය කළ හැකි නම් එය ඉතා ප්‍රයෝජනවත්ය.

## ආනයනික කිරිපිටි සම්බන්ධ ගැටලු

පාන්පිටි හැරුනු විට, මෙරට දේශපාලන වශයෙන් පවා තීරණාත්මක වන පිටි වර්ගයක් වේ නම් ඒ කිරිපිටි පමණි. ඒ විශේෂයෙන්ම ආනයනික කිරිපිටිය. කිරිපිටි මිල ඉහළ යෑම සමාජයේ අවධානයට ලක්වන්නකි. එසේම දේශීය ආහාරපාන භාවිතයට ගැනීම පිළිබඳව ව්‍යාජ තොරතුරු පැතිරවීම හා කිරිපිටිවල අත්‍යවශ්‍යභාවය පිළිබඳ මිථ්‍යාව ව්‍යාප්ත කිරීමට විවිධ මාධ්‍ය හරහා කළ උත්සාහය මේ වන විට එහි උපරිමයෙන් කරලියට පැමිණ ඇති බව පෙනේ.

ශ්‍රී ලංකාවට කිරිපිටි ආනයනය කරන විවිධ සමාගම් විසින් මෙරටට ගෙවනු ලබන කිරිපිටි වර්ගවල ගුණාත්මක බව පිළිබඳව ගැටලු කලක පටන් පැන නැගී තිබේ.

ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන කිරිපිටිවල විකිරණ තිබීමේ අවදානමක් 1980 දශකයේ ඇතිවූ චර්නොබිල් න්‍යෂ්ටික අනතුර අවස්ථාවේදී වාර්තා විය. ඒ අවස්ථාවේදී යුරෝපීය රටවලින් කිරි ආහාර මෙරටට ආනයනය කිරීම ආරක්ෂිත බව පිළිබඳව සාකච්ඡාවක් ඇති විය.

පසුකලක, එ නම් 1993 නොවැම්බර් මස මෙරටට ගෙන ආ කිරිපිටි මෙට්‍රික් ටොන් 150ක තොගයක හානිකර මට්ටමින් විකිරණ අඩංගු බව කොළඹ විශ්ව විද්‍යාලයේ විකිරණශීලී සමස්ථානික මධ්‍යස්ථානය වාර්තා කළේය. සම්මත මිනුම් අනුව කිරිපිටි කිලෝවක තිබිය හැකි උපරිම විකිරණශීලීතාව බෙකරල් 20ක් වුවද, අදාළ කිරිපිටි තොගයෙන් ලබාගත් නියැදියේ බෙකරල් 50 ක විකිරණශීලීතාවක් වාර්තා විය.




බටහිර රටවලින් විකිරණ සහිත කිරි පැමිණෙන බව දැක්වෙන දැන්වීමක්

මේ අතර චීන කිරිපිටි සමාගමක නිපද වූ කිරිපිටිවල 'මෙලමයින්' නම් රසායනික ද්‍රව්‍යය ඇතුළත් වීම නිසා දරුවන් දහස් ගණනක් රෝගී වීමත්සමග ශ්‍රී ලංකාවට ආනයනය කරන කිරිපිටි භාවිතා කොට සකසන විවිධ ආහාර වර්ග පිළිබඳවද ගැටලුවක් 2008 වර්ෂයේදී පමණ පැතිර ගියේය. දේශීය චොක්ලට් සමාගමකට එරෙහිවද පාරිභෝගික අධිකාරිය අධිකරණය හමුවට නඩුකරයක් ගොනුකරන ලද අතර, දේශීය බිස්කට් සමාගමක නිරීක්ෂණය කරන ලද බිස්කට් තොගයක මෙලමයින් රසායනිකය අඩංගු වී ඇතැයි පවසා එම බිස්කට් තොගය ආපසු හරවා යවන ලදි

ආනයනික කිරිපිටිවල ගුණාත්මක බව පිළිබඳව වඩාත් මෑතදී ඇති වූගැටලුව වන්නේ, ආනයනික කිරිපිටි වර්ග කිහිපයක ශරීරයට අහිතකර විෂ රසායනිකයක් වන ඩයිසයන්ඩයමයිඩ් (DCD) අන්තර්ගත වන බවට පරීක්ෂණවලින් අනාවරණය වීමයි. එසේම වේ ප්‍රෝටීන ඇතුළත් කිරි ආහාරවලට බැක්ටීරියාවක් මිශ්‍රවීම නිසා ඇතිවූ ගැටලුවද මේ තත්ත්වය තවදුරටත් සංකීර්ණ කළේය.

මේ එක් එක් ගැටලු පිළිබඳව මදක් විස්තර සහිතව විමසා බලමු.

## DCD අර්බුදය




DCD යනු රසායන විද්‍යාත්මකව 2-Cyanoguanidine ($C_2H_4N_4$) ලෙස හැඳින්වෙන රසයක්, ගන්ධයක් නොමැති, ජලයේ ද්‍රාවණය වන, විසිරී යන, රත්කළ විට කුඩු බවට පත්වන රසායනිකයකි. මේ රසායනික ද්‍රව්‍යය පොහොර නිෂ්පාදනය හා ප්ලාස්ටික් නිෂ්පාදනය සඳහා භාවිතයට ගැනෙන්නකි. නයිට්‍රේට ජල මාර්ගවලට එක් වීම වැළැක්වීම සඳහා නයිට්‍රජන් බාධකයක් (nitrogen inhibitor) ලෙස හා හරිතාගාර වායු විමෝචන අඩු කිරීම සඳහා තෘණභූමිවල යොදාගනු ලැබේ. නයිට්‍රිකරණ ක්‍රියාවලියේදී ඇමෝනියා නයිට්‍රේට බවට පත්වීම වළක්වාලීමට DCDවලට හැකියාව තිබීම මීට හේතුවයි. මේ නිසා නයිට්‍රජන් වැඩි වශයෙන් පසේ රඳවාගැනීමටත් වැඩි ඵලදායකත්වයක් ලබාගැනීමේ අරමුණ ඇතිව නවසීලන්තයේ තෘණබිම්වල 2004 පමණ සිට DCD රසායනිකය යොදාගෙන ඇත්තේ නව තාක්ෂණයක් ලෙසිනි. අදාළ කාර්යය සඳහා මේ රසායනයට හැකියාවක් ඇති බව ඒ කාලයේ සිදුකර ඇති පර්යේෂණ ගණනාවක් මගින් පෙන්වාදී තිබේ.




කෙසේ වෙතත් මේ රසායනික ද්‍රව්‍යය මගින් වෙනත් බලපෑම් ඇති වී තිබේ. DCD සහිත තෘණ ආහාරයට ගන්නා එළදෙනුන්ගේ කිරිවල ඒවා සුළු ප්‍රමාණවලින් ඇතුළත් විය හැකි බව පසුව අනාවරණය විය. පසුගිය 2012 වර්ෂයේ සැප්තැම්බරයේදී නවසීලන්තයේ සිදු කළ පරීක්ෂණවලින් මේ බව තහවුරු වී තිබිණි. මේ බව නවසීලන්තයේ ෆොන්ටෙරා සමාගම විසින් එරට රජයට දැනුම්දී තිබිණි. මේ සම්බන්ධව එරට ඇතුළත මහත් ආන්දෝලනයක් ඇති වූ අතර, මේ වර්ෂයේ ජනවාරි මාසයේදී නවසීලන්තයේ ප්‍රධාන පෙළේ පොහොර සමාගම් දෙකක් (Ravensdown හා Ballance Agri-Nutrients) වෙළෙඳපොළෙන් DCD ඉවත් කරගන්නා බව ප්‍රකාශ කළේය. මේ සම්බන්ධව නවසීලන්ත රජය ගත් ක්‍රියාමාර්ග එරට මාධ්‍යවල විවේචනයට ලක්විය. රජය පවසා තිබුණේ කිරිවල DCD අඩංගු වූ ප්‍රමාණය ගැටලු සහිත මට්ටමක නොවන බවය. එළදෙනුන්ට තණ කැවීමට යොදා ගන්නා තෘණ භූමිවලට මේ DCDරසායනිකය යොදා ගැනීමට එරෙහි වූ නවසීලන්ත හරිත පක්ෂය පෙන්වාදී තිබුණේ රසායනික ද්‍රව්‍යවල ආරක්ෂිත සීමා පෙන්වාදීම වෙනුවට තිරසර පශු පාලනයක් පිළිබඳව උනන්දුවක් දැක්විය යුතු බවය. මේ බව New Zealand Herald පුවත්පත වාර්තා කර තිබිණි.

කෙසේ වෙතත්, නැවුම් කිරිවල ඇතුළත් මේදය හා ප්‍රෝටීන් වැනි පෝෂ්‍ය කොටස් ඉවත් කරගත් පසුකිරිපිටිවල ඇති ප්‍රෝටීන් ප්‍රතිශතය ඉහළ බව පෙන්වීම සඳහා DCD රසායනිකය කිරිපිටිවලට එක්කරන බවටද සැක මතු වී තිබේ. ඒ අරමුණින් කිරිපිටිවලට මිශ්‍ර කළ මෙලමයින් අයත්වන කාණ්ඩයටම DCDද අයත් වේ. එහිද නයිට්‍රජන් ඇතුළත් නිසා ප්‍රෝටීන හඳුනාගැනීම සඳහා යොදා ගන්නා පරීක්ෂණවලට ප්‍රතිචාර දක්වයි.

DCD අඩංගු කිරි ආහාර භාවිතා කිරීමෙන් ශරීර සෞඛ්‍යයට බලපෑම් ඇති විය හැකි බව පැවසේ. මේ රසායනික ද්‍රව්‍යය දිගුකලක් ශරීරගත වීමෙන් ස්නායු පද්ධතිය, ශ්වසන පද්ධතිය හා වකුගඩු ආශ්‍රිත ආබාධ ඇතිවිය හැකිය. වකුගඩු ක්‍රියාකාරිත්වය අඩපණ වීම හා කුඩා දරුවන්ට අඩු වයසින් වකුගඩු රෝග ඇතිවීමටමේ රසායනික ද්‍රව්‍යය හේතුවිය හැකිබව අනාවරණය වී තිබේ. එසේම ශ්වසන රෝග බහුලව ඇතිවීමට හා දිගින් දිගටම සෙම් රෝග ඇති වීමටද මෙය හේතුකාරක වේ. ස්නායු පද්ධතිය දුර්වල වීමටද, අඩපණ වීමටද හේතු කාරක වන DCD රසායනිකය, මලබද්ධය හා බහිශ්‍රාවීය පද්ධතිය ආශ්‍රිතව රෝග ඇතිවීමටද වැඩි ඉඩකඩක් ලඟාකර දෙයි. මින් සිදුකෙරෙන වඩාත් බරපතළ ආපදාව වන්නේ ශරීරයේ නිර්මාණය වන විකෘති සෛල වර්ධනය වීමට එරෙහිව ක්‍රියා කළ හැකි ශරීර ප්‍රතිශක්තිය හීන වී යාමයි.

අවාසනාවකට මෙන්, DCD රසායනිකය ආහාරවල ඇතුළත් විය හැකි සෞඛ්‍යයට ආරක්ෂිත ප්‍රමාණයක් පිළිබඳව ජාත්‍යන්තර එකඟතාවයක් තවමත් ඇති වී නොමැත.

## ශ්‍රී ලංකාවේ DCD බලපෑම

කිරිපිටිවල ඇතුළත් DCD පිළිබඳව මෙරට සෞඛ්‍ය බලධාරීන් දැනුම්වත් කිරීමට පසුගිය ජනවාරි මාසයේදී පමණ නවසීලන්ත තානාපති අංශ පියවර ගෙන තිබිණි.

පාරිභෝගික සේවා අධිකාරිය මගින් කිරිපිටි නිදර්ශක පරීක්ෂා කිරීම සඳහා සිංගප්පූරුවට වවන ලද, මෙරට වෙළෙඳපොළේ ඇති කිරිපිටි වර්ග 05 ක පමණ DCD රසායනිකය අඩංගු බව පාරිභෝගික සේවා අධිකාරිය විසින් තහවුරු කර ගන්නා ලදි. එම වර්ග හා ප්‍රමාණ 1 වගුවේ දැක්වේ.

| කිරිපිටි වර්ගය | DCD ප්‍රතිශතය |
|---|---|
| ලක්ස්ප්‍රේ | 15.17% |
| රත්ති | 7.42% |
| මැලිබන් | 0.46% |
| ඇන්කර් | 0.43% |
| නෙස්ප්‍රේ | 0.36% |

1 වගුව: මැයි මාසයේදී ශක අඩංගු වූ කිරිපිටි (ලංකාදීප, 2013 මැයි 20)

ශ්‍රී ලංකාවට ආනයනය කරන ආනයනික කිරිපිටි වර්ගවල උක්ත රසායන ද්‍රව්‍ය අඩංගු නොවන බවට පිළිගත් රසායානාගරයකින් සහතිකයක් තිබීම අනිවාර්ය කිරීමට මැයි මස 14 වැනි දින මෙරට සෞඛ්‍ය බලධාරීහු කටයුතු කළෝය.

කෙසේ වෙතත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඇතැම් නිලධාරීන්ගේ ක්‍රියාකාරිත්වය මේ සිදුවීම පිළිබඳ උනන්දුවක් දක්වන පිරිස්වල විවේචනයට ලක්ව තිබේ. DCD පිළිබඳව ලෝක සෞඛ්‍ය සංවිධානයේ මතය දක්වමින් දේශීය වෙළෙඳපොළේ ඇති ආනයනික කිරිපිටිවල අඩංගු රසායනික ප්‍රමාණය මිනිස් ශරීරයට හානියක් කිරීමට තරම් අධික ප්‍රමාණයක් නොවන බව මේ සෞඛ්‍ය බලධාරීන් පළමුව පෙන්වා දී තිබිණි.

මේ අතර 2013 ජුලි මස 26 දින කාර්මික හා තාක්ෂණ ආයතනය (ITI) විසින් ආනයනික කිරි පිටි සම්බන්ධයෙන් නිකුත් කළ පරීක්ෂණ වාර්තාවේ පැහැදිලිව දක්වා තිබුනේ පරීක්ෂාවට ලක් කරන ලද ආනයනික කිරිපිටි වර්ග හතරක DCD ඇතුළත් වූ බවය. විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට අයත් කාර්මික තාක්ෂණ ආයතනය නිකුත් කළ මේ වාර්තාව පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යාංශය මුලින් නිද්‍රාශීලී ප්‍රතිපත්තියක් අනුගමනය කළ බවක් පෙනේ. මේ පිළිබඳ බොහෝ විවේචනද දැකිය හැකි විය. අගෝස්තු මස 5 වන දින මේ සම්බන්ධව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් නිකුත් කරන ලද නිවේදනයකින් දක්වුනේ තායිලන්ත වාර්තාවක් පදනම් කර ගනිමින් සෞඛ්‍ය අමාත්‍යාංශය කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්තාව නොසලකා හරින බවයි.

කෙසේ වෙතත්, අගෝස්තු 8 දින සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ නිලධාරියකු විසින් නිකුත්කළ විධාන අංක 2013/7 අනුව DCD සහිත කිරිපිටි වර්ග 4කට අයත් (ඇන්කර් 1+, ඇන්කර්, මැලිබන් නොන් ෆැට් හා ඩයමන්ඩ්) කාණ්ඩ 4ක කිරිපිටි මුද්‍රා තබා රඳවා තැබීමට නියෝග කරන ලදි. ඉන් අනතුරුව අගෝස්තු 23 දින නිකුත් කළවිධාන අංක 2013/8 අනුව දක්වෙන්නේ අදාළ ආහාර සුදුසු පරිදි විනාශ කරන ලෙසය. එසේම 2013 අගෝස්තු 30 දින නිකුත් කළ 2013/23 විධානය අනුව, කාර්මික තාක්ෂණ ආයතනයේ විශ්ලේෂණ මත තවත් කිරිපිටි වර්ගයක (මිල්ග්‍රෝ) එක් කාණ්ඩයක් DCD අඩංගු නිසා අලෙවිය තහනම් කර විනාශ කිරීමට නියෝග කරනලදි.

මේ අතර මෙරට වෙළෙඳපොළෙන් ලබාගත් කිරි ආහාර නියැදි කාර්මික තාක්ෂණ ආයතනයේ පරීක්ෂාවට ලක් කිරීමෙන් පසුව අගෝස්තු 31, සැප්තැම්බර් 2 හා 18 යන දිනවල ඇතැම් කිරිපිටි කාණ්ඩවලට අයත් කිරිපිටි DCD ඇතුළත් නොවන බව සෞඛ්‍ය අමාත්‍යාංශය තහවුරු කර ඇත. එසේම මෙදිනම නිකුත් කළ තවත් විධානයකට අනුව, 2013 ජුනි 01 දිනට පෙර නිෂ්පාදිත ආනයනය කර ඇති කිරිපිටි තහනම් කර නියැදි ලබාගෙන පරීක්ෂා කිරීමට නියෝග කර ඇත.

## වේ ප්‍රෝටීන සිදුවීම

පසුගිය අගෝස්තු මාසය මුල් භාගයේදී චීනය හා රුසියාව යන රටවල් නවසීලන්තයෙන් කිරිපිටි ආනයනය කිරීම වහාම ක්‍රියාත්මක වන පරිදි නවත්වා දමන ලදී. ඒ *Clostridium botulinum* නම් වූ බැක්ටීරියාව ඉහත කී කිරිපිටිවල අන්තර්ගත වීම නිසාය. මේ බැක්ටීරියාව අන්තර්ගතව තිබුණේ වේ ප්‍රෝටීන (whey Protein) නම් වූ ක්‍රීඩකයන්ගේ මාංශ පේශී වර්ධනය ප්‍රධාන කොටගත් කිරි ආහාර විශේෂවලය.



මේ සමඟ අදාළ කිරිපිටි තොග ආපසු කැඳවීමට නවසීලන්ත බලධාරීන් පියවර ගත්තේය. මේ ආපසු කැඳවීම සිදුකරන ලද්දේ නවසීලන්තයේ ෆොන්ටෙරා සමාගම විසින් වන අතර, ඒ වයිකාටෝහි පිහිටි කර්මාන්තශාලාවක නළ පද්ධතියකින් අදාළ බැක්ටීරියාව කිරි ආහාරවලට එක් වී ඇති බව පවසමිනි. ඔවුන් මේ පිළිබඳව සමාවද ඉල්ලා තිබිණි. ක්ලොස්ට්‍රිඩියම් බොටුලිනම් බැක්ටීරියාව විවිධ විෂ ද්‍රව්‍ය රැසක් නිපදවන අතර, එය බොතුලිනියාව හෙවත් විෂවීම්වලට හේතු වේ. මේ විෂ මගින් අංශ භාගය හා ස්නායු ආබාධ වැනි භයානක ලෙඩ රෝග පවා ඇතිවිය හැකි බව වෛද්‍ය මතයයි.

## ශ්‍රී ලංකාවේ ප්‍රතිචාරය

ක්ලොස්ට්‍රිඩියම් බොටුලිනම් බැක්ටීරියාවෙන් කිරි දූෂණය වීමක් ඇතිවුවහොත් ගත යුතු පියවර ගැනීමට මෙරට ආහාර බලධාරීන් පියවර ගෙන තිබිණි. පැවති තත්ත්වය හමුවේ, වේ ප්‍රෝටීන අඩංගු යැයි සැලකෙන කිරිපිටි වර්ග වෙළෙඳපොළට නිකුත් කිරීම තහනම් කර, වෙළෙඳපොළට නිකුත් කර ඇති එවැනි කිරිපිටි වර්ග රැසක් වෙළෙඳපොළින් ඉවත් කිරීමට අගෝස්තු 5 දිනශ්‍රී ලංකාවේ සෞඛ්‍ය බලධාරීන් විසින් විධාන අංක 2013/5 මගින් නියෝග ලබාදෙන ලදී. ඒ අනුව වේ ප්‍රෝටීන අඩංගු යැයි සැලකෙන නිෂ්පාදන ගණනාවක් විකිණීම තාවකාලිකව අත්හිටුවන ලද අතර ඒවයෙන් නියැදි ලබාගෙන වෛද්‍ය පර්යේෂණායතනය වෙත යැවීමට නියෝග ලබාදී තිබිණි.

මෙරට භාවිත වන කිරි ආහාර වර්ග ගණනාවක, වේ ප්‍රෝටීන ඇතුළත් විය. සමස්තයක් ලෙස ගතහොත් කිරිපිටි වර්ග 26ක් හා තවත් කිරි ආහාර වර්ග රැසක් වෙළෙඳපොළින් ඉවත් කිරීමට නියෝග කරන ලදි. මෙහිදී රජයේ තීරණයට එරෙහිව සිය නිෂ්පාදන වල ගුණාත්මක බව හා සුරක්ෂිත බව ප්‍රකාශ කරන දැන්වීම් විවිධ මාධ්‍ය ඔස්සේ අදාළ කිරිපිටි සමාගම් විසින් ප්‍රකාශ කරනු දැකිය හැකි විය. කෙසේ වෙතත්, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය වැනි සංවිධාන මේ පිළිබඳව දැඩි අවධානයකින් පසුවූ අතර, එය මහජනතාවගේ පැත්තෙන් සුභවාදී ලක්ෂණයකි.

වේ ප්‍රෝටීන අඩංගු කිරිපිටි විකිණීම තාවකාලිකව අත්හිටුවා පරීක්ෂණ සඳහා නියැදිලබා ගැනීමට තහනම් කිරීමට නියෝග කරන ලද්දේ අගෝස්තු 6 දිනය (විධාන 5). කෙසේ වෙතත් වෛද්‍ය පර්යේෂණායතනයේ විශ්ලේෂණවලින් අදාළ බැක්ටීරියාව ඇතුළත් නොවන බව තහවුරු කිරීමෙන් පසු, විකිණීම තහනම් කර තිබූ වර්ග

**වේ ප්‍රෝටීන යනු මොනවාද?**

එළ කිරි යොදාගනිමින් සිදුකරන චීස් නිෂ්පාදනයේ අතුරුඵලයක් ලෙස ලබාගන්නා දියරමය මෝරු මගින් වෙන්කර ගන්නා ප්‍රෝටීන මිශ්‍රණයක් වන Whey Protein යනු කිරිවල ඉතාම පෝෂණීය ප්‍රෝටීන මිශ්‍රණයකි. මෙහි නයිට්‍රජන් ඉතා අධිකය.

ක්‍රීඩකයන්ගේ මාංශ පේශී වර්ධනය වැනි ප්‍රයෝජන සඳහා මේ ප්‍රෝටීනය වෙන්කර භාවිත කරනු ලැබේ. මේවායින් සිරුරේ වර්ධක හෝමෝන ස්‍රාවය වේගවත් කරනු ලබයි. ශක්තිජනක පාන වර්ග, ක්‍රීඩකයන් සඳහා නිපදවනු ලබන අතිරේක කිරිපිටි වර්ග වැනි කිරි ආශ්‍රිත නිෂ්පාදනවල මේ whey Protein අඩංගුය.

රසක්ම අගෝස්තු 22 දින සිට වරින්වර නිදහස් කරන ලදි. (විධාන 9,11,17,25,26) එසේම, ඇතැම් කිරිආහාරවල ඇතුළත් වේ ප්‍රෝටීන නිෂ්පාදනය කර නවසීලන්තයෙන් පිට වෙනත් රටක බවට අදාළ තානාපති කාර්යාලවලින් හෝ අදාළ සමාගම් විසින් ලබාදුන් සහතික මත ඇතැම් නිෂ්පාදන නිදහස් කර තිබේ. (විධාන 16,20,)

මේ අතර DCD නොමැති බව හා ක්ලොස්ට්‍රිඩියම් බොටුලිනම් බැක්ටීරියාව නොමැති බව හා නවසීලන්තයේ නිෂ්පාදිත වේ ප්‍රෝටීන නොමැති බව තහවුරුකළ විට ඇලවීම සඳහා වූ ස්ටිකර තුනක් අගෝස්තු 23 දින විධාන 2013/10 මගින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙන ලදි. එහෙත් එහි රාජ්‍ය ලාංඡනය තිබීම පිළිබඳව මතු වූ විරෝධය නිසා මෙය සැප්තැම්බර් 4 දින රාජ්‍ය ලාංනය හා සෞඛ්‍ය අමාත්‍යාංශය යන වචන ඉවත් කිරීමට නියෝග කරන ලදි.




මුලින්ම නිකුත් කළ ලේබල්

කෙසේ වෙතත් අනෙක් වැදගත් කරුණ වන්නේ වේ ප්‍රෝටීන මගින් පවසන තරම් ප්‍රයෝජනයක් ලැබෙන්නේද යන්නය. අධි සාන්ද්‍රික වේ ප්‍රෝටීන සංඝටකය අඩංගු විශේෂිත කිරිපිටි වර්ග, ක්‍රීඩකයන් හා නිලියන් වැනි පිරිස් යොදාගනිමින් ජනතාවට වඩාත් සුදුසු පෝෂණීය ආහාර ලෙස හුවා දක්වන ආකර්ෂණීය වෙළඳ දැන්වීම් අපේ ජනමාධ්‍යවල පළකරනු දැකිය හැකිය. එහෙත් ඒවා මගින් පොදුවේ සමාජයට ලබාදෙන පණිවිඩයේ අයහපත් භාවය පිළිබඳව කිසිදු විද්‍යුත් හෝ වෙනත් මාධ්‍යයක් වගකීම දරන්නේ නැත. එසේම කිසිදු විද්‍යුත් හෝ ලිඛිත ප්‍රකාශන මාධයක් විසින් දේශීයව පිළියෙල කෙරෙන කොලකැඳ හෝ දේශීය ඖෂධීය පාන පිළිබඳව ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබා දෙනු දැකීම ඉතා දුර්ලභය.

මේ සම්බන්ධව ජාතික ක්‍රීඩා වෛද්‍ය ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය අර්ජුන සිල්වා මහතා පවසන පරිදි ක්‍රීඩකයෙකුට ජයග්‍රහනය ලබාදෙන්නේ ජාන, නිසි පුහුණුව හා හොඳ පෝෂණය විනා මෙවන් අහිතකර ප්‍රචාරක මාධ්‍යවලින් ලැබෙන පන්නරය නොවේ. මිනිස් දරුවෙකුට දිය හැකි හොඳම හා ප්‍රශස්තම ආහාරය මව් කිරි බවත්, ඒ වෙනුවට කිසිදු ආදේශකයක් නොමැති බවත් ඔහු පවසයි. තවද පිටිකිරි භාවිතය අත්හිටුවා ඉන්දියාව මෙන් දේශීය නිෂ්පාදන පරිභෝජනයට ඇල්මක් ඇති කරගෙන කඩිනමින් දියර කිරි භාවිතයට අප නැඹුරු විය යුතු බවත් ඔහුගේ අදහසයි.

මේ අතර ආපසු කැඳවන ලද අදාළ කිරිපිටි වර්ගවල අන්තර්ගත ද්‍රව්‍ය පරීක්ෂා කිරීමෙන් පසුව නවසීලන්ත රජය අගෝස්තු මස අගදී ප්‍රකාශ කළේ ක්ලොස්ට්‍රිඩියම් බොටුලිනම් අදාළ බැක්ටීරියාව පිළිබඳ සාධක හමු නොවූ බවය. කෙසේ වෙතත් එතරම් හානිකර නොවන වෙනත් බැක්ටීරියාවක් වන *Clostridium sporogenes* හමුවූ බවද මේ පිළිබඳ පුවත් වාර්තාවල සඳහන් විය. මේ බැක්ටීරියාව බොටුලිසම් තත්ත්වය ඇති නොකරන අතර ඉන් ආහාර විෂවීම සිදුවිය හැකිය.

මේ තොරතුරු හෙළි වීමත් සමඟ ඇති වූ තත්ත්වය සැලකිල්ලට ගත් ශ්‍රී ලංකාවේ ආහාර උපදේශක කමිටුව සැප්තැම්බර් 9 දින මෙරට වෙළෙඳපොළේ ඇති ආහාර, ක්ලොස්ට්‍රිඩියම් බොටුලිනම් බැක්ටීරියාව මගින් දූෂණය වීමේ අවදානම ඉතා අවම බව තීරණය කරන ලදි. මේ නිසා රඳවා ඇති තොග නිදහස් කිරීමට මෙන්ම යළි නියැදි ලබා නොගැනීමටද තීරණය වී ඇත. කෙසේ වෙතත් ඇතැම් ආහාර රේගුවේදී නියැදි ලබාගෙන පරීක්ෂා කිරීමටද මෙහිදී වැඩිදුරටත් එකඟතාවය පළ වී තිබේ.

## මෙලමයින් සිදුවීම

2008 වර්ෂයේ අගභාගයේදී කිරිපිටිවල මෙලමයින් අන්තර්ගත වීම නිසා ඇති වූ විෂ වීම දැක්විය ළදරු කිරි ආහාර හා කිරි ආශ්‍රිත නිෂ්පාදිත වෙළෙඳපොළේ විශාල ආන්දෝලනයකට හේතුව විය.

'මෙලමයින්' (Melamine) යනු රසායන විද්‍යාත්මකව 1,3,5-Triazine-2,4,6-triamine($C_3H_6N_6$)යනුවෙන් හඳුන්වනු ලබනකෘත්‍රිමව නිපදවන නයිට්‍රජන් අඩංගු කාබනික රසායනික ද්‍රව්‍යයකි. එහි බරින් 66%ක් පමණ ඇත්තේ නයිට්‍රජන්ය. මෙලමයින් බොහෝ නිෂ්පාදන සඳහා යොදාගැනේ. මෙලමයින් යොදාගනිමින් සාදන කල්පවත්නා තාපස්ථායී ප්ලාස්ටික් වර්ගයක් වන මෙලමයින් රෙසිනය, පිඟන් බඳුන්, ෆෝමිකා හා බිම් ආවරණ ආදිය සෑදීම සඳහා යොදාගනු ලැබේ. එසේම මෙලමයින් යොදාගනිමින් නිපදවනු ලබන ෆෝම් වර්ග තාප පරිවරණය, ශබ්ද පරිවරණය වැනි කාර්ය සඳහා යොදාගත හැකිය. එසේම ජලනළ බට ප්ලාස්ටික් කොටස් සම්බන්ධ කිරීමට ගන්නා මැලියම් සෑදීමටද මේවා යොදාගනු ලැබේ.




මෙලමයින්වල ඇති අධික නයිට්‍රජන් ප්‍රතිශතය නිසා, ප්‍රෝටීන් ගුණාංගයක් වශයෙන් අතීතයේදී සත්ව ආහාරවලට මෙලමයින් මිශ්‍ර කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස ඇතැම් සතුන් වකුගඩු අක්‍රිය වීමෙන් මිය ගොස් තිබුණි.

කෙසේ වෙතත්, කිරි ඇතුළු ආහාරවර්ගවල ප්‍රෝටීන් සංයුතිය වැඩිකර පෙන්වීම සඳහා නීති විරෝධී ආකාරයෙන් භාවිත කරන බව කලක පටන් වාර්තා වී තිබේ. නයිට්‍රජන් ප්‍රතිශතය අනුව ප්‍රෝටීන ප්‍රමාණය තීරණය කරන කෙල්ඩාල් (Kjeldahl) හා ඩූමාස් (Dumas) පරීක්ෂණවලදී මෙලමයින්ද ප්‍රෝටීන සේ හඳුනාගැනීම සිදු වේ. ඒ නිසා මෙලමයින් ආහාරවලට එක් කරනු ලැබේ. ආහාරයක පෝෂණ අගය මැන බැලීමේදී එහි අඩංගු ප්‍රෝටීන් ප්‍රතිශතය විශේෂයෙන්ම සලකා බැලෙන බැවින් කිරිපිටිවල අධිකව ප්‍රෝටීන තිබීම අත්‍යවශ්‍ය දෙයක් ලෙස පාරිභෝගික ජනතාව සලකති. මේ නිසා වැඩි ප්‍රෝටීන් ප්‍රතිශතයක් අඩංගු කිරි ආහාරවලට වැඩි ඉල්ලුමක් තිබේ. එහෙත් සත්‍ය වශයෙන්ම මෙලමයින්හි ප්‍රෝටීන් ගුණාංගයක් නොමැත. ප්‍රෝටීන ඉවත් කරනලද කිරිපිටිවලට, ඉහළ නයිට්‍රජන් ප්‍රතිශතයක් ඇති මෙලමයින් රසායනිකය එක් කිරීමේ එහි ප්‍රෝටීන් ප්‍රමාණය ව්‍යාජ ලෙස වැඩි කර පෙන්විය හැකිය.

කිරිපිටි නිපදවන චීන සමාගම් කිහිපයක් මෙලමයින් කිරිපිටිවලට හා ළදරු කිරිපිටිවලට මිශ්‍ර කර ඇතිබව 2008 වර්ෂයේදී අනාවරණය වීම දැඩි ආන්දෝලනයකට පාදක විය. මේ සිදුවීමේදී මෙලමයින් විෂ වීමෙන් විශාල පිරිසකට බරපතළ සෞඛ්‍ය ගැටලු ඇති වූ අතර, ඉන් 290,000ක් පමණ ළමයින් විය. වඩාත් බරපතළ වූයේ වකුගඩු හා මුත්‍රා මාර්ගය ආශ්‍රිත රෝගාබාධයි. මේ සිදුවීමට හේතු වූ සන්ලු (Sanlu) නම් චීන සමාගම කිරිපිටිවලට මෙලමයින් එක් කළ බව පිළිගත්තේය. මීට වරදකරුවන් වූ පුද්ගලයින්ට දැඩි දඬුවම්දීමට චීන රජය පියවර ගත්තේය.මේ සිදුවීමට හේතු වූ සන්ලු සමාගමේ කොටස්වලින් 43%ක් නවසීලන්තයේ ෆොන්ටෙරා සමාගමට අයත්ව තිබූ බව සඳහන් වේ.

මෙලමයින් නිසා විවිධ සෞඛ්‍ය ගැටලු ඇති විය හැකිය. දැඩි ලෙස මේ රසායන ද්‍රව්‍යයට නිරාවරණය වීමෙන් පිළිකා හා ප්‍රජනන පද්ධතියේ ආබාධ ඇති වීම අවදානමක් ඇත. එසේම මේ රසායනික ද්‍රව්‍යය නිසා සම, ඇස හා ශ්වසන පද්ධතියේ අසාත්මිකතා වැනි ගැටලු ඇති වේ. එසේම මෙලමයින් නිසා වඩාත්ම හානි සිදුවන්නේ වකුගඩුවලටය. ඒ මෙලමයින් මිනිස් ශරීරයේ පවත්නා සයනුරික් අම්ල (Cyanuric Acid) නම් රසායනිකය සමඟ මෙලමයින් ප්‍රතික්‍රියා කිරීමෙන් මෙලමයින් සයනුරික් (Melamine Cyanuric) නැමැති ද්‍රව්‍යයක් සෑදීම නිසාය. මේ ද්‍රව්‍ය ජලයේ දිය නොවන අතර, වකුගඩුවල ඇතැම් සෛලවල සියුම් කැබලි ලෙස තැන්පත් වී අවසානයේදී වකුගඩුවල ක්‍රියාකාරීත්වයට හානි වී තවදුරටත් මූත්‍රාශයටත්, ප්‍රජනන පද්ධතියටත් ඉන් බලපෑම් සිදුවිය හැකිය.

මෙලමයින් ශරීරගත විය හැකි ආරක්ෂිත දෛනික ප්‍රමාණයක් ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් නියම කර තිබේ. ඒ දිනකට ශරීර බරෙහි කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් 0.2ක් ලෙසය. විවිධ රටවල මීට වඩා වෙනස්

සීමා ඇති අතර, මෑතදී ඇති වූ ආන්දෝලනයත් සමඟබොහෝ රටවල් ආරක්ෂිත පියවරක් ගනිමින් මේ අන්තරායකර සීමාව පහළ දමා තිබේ.

ලෝක ආහාර සංවිධානය හා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ජාත්‍යන්තර ආහාර ප්‍රමිති නියම කිරීම සඳහා පිහිටුවා ඇති 'කොඩෙක්ස් ඇලිමෙන්ටාරුස් කොමිසම' 2010 වර්ෂයේදී ආහාරවල මෙලමයින් තිබිය හැකි උපරිම ප්‍රමාණයක් නියම කළේය. ඒ අනුව ළඳරු ආහාර කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් 1කට අඩුවෙන් සහ අනෙක් ආහාරවල කිලෝග්‍රෑම් එකකට මිලි ග්‍රෑම් 2.5කට අඩුවෙන් මෙලමයින් තිබීම ආරක්ෂිත සේ දක්වේ. මේ සීමා නෛතික නුවූවද, මේ ප්‍රමාණය ඉක්මවා යන අවස්ථාවලදී එම ආහාර ප්‍රතික්ෂේප කිරීමට රටවලට අයිතිය ලැබේ.

## ශ්‍රී ලංකාවේ මෙලමයින් හමුවීම

මෙලමයින් ආන්දෝලනය ඇති වූ අවස්ථාවේදී, ශ්‍රී ලංකාවේ චොක්ලට් නිෂ්පාදන ආයතනයක හා බිස්කට් නිෂ්පාදන ආයතනයක නිෂ්පාදනවල මෙලමයින්රසායනිකය අඩංගුව ඇතැයි අනාවරණය වීම නිසා පාරිභෝගිකයින් බෙහෙවින් කැලඹීමට පත්වූ අතර, ජනතාව පරිභෝජනයට ගන්නා වෙනත් කිරි ආශ්‍රිත ආහාරවල මෙලමයින් අඩංගු වී තිබේද යන්න පිළිබඳව නිරන්තර විමසිලිමත් වූහ. මෙහිදී සිදුව තිබුණේ දේශීය කිරි ආශ්‍රිත නිෂ්පාදන නිපදවන සමාගම් විසින් චීන කිරි සමාගම් වෙතින් මෙලමයින් මිශ්‍ර කර ප්‍රෝටීන අගය ව්‍යාජ ලෙස ඉහළ නංවන ලද කිරිපිටි මිලදී ගෙන නොදැනුවත්වම සිය නිෂ්පාදනවලට යෙදීමකි.

මෙලමයින් රසායනිකය පිළිබඳව හා ඉන් සෞඛ්‍යයට ඇතිවිය හැකි බලපෑම පිළිබඳව ජනමාධ්‍ය හරහා ජනතාව දැනුවත් කරන ලදි. මේ නිසා ඇතිවූ අවාසිදායක තත්ත්වය මගහැරවීම සඳහා අදාළ සමාගම් විසින් තම ආහාරවල සුරක්ෂිත භාවය පිළිබඳව දැන්වීම් පළ කිරීමටද පියවර ගෙන තිබිණි.

මේ අවස්ථාවේදී මෙරට සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ලෝක සෞඛ්‍ය සංවිධානයේ දැනුවත් කිරීම මත පියවර ගත් අතර, වෙනත් රටවලින් ආනයනය කළ කිරි හා ඒ ආශ්‍රිත ආහාර වර්ග අතරින් චීනයෙන් ආනයනය කළ ඒවා හැර අනික් තොග රේගුවෙන් නිදහස් කර අදාළ ගබඩා වෙත යැවීමටත්, චීනයෙන් ආනයනය කළ තොග රේගුවේම රඳවා තැබීමටත් නියෝග කරන ලදී.

මේ අතර චොක්ලට් නිෂ්පාදනය කරන දේශීය කම්හලකට එරෙහිව කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු දෑ අඩංගු කර ආහාර නිපදවීම සම්බන්ධව පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් නඩු පවරන ලදී. අවසානයේදී චීනයෙන් ගෙන්වන කිරිපිටි නොයොදා, ආහාර පාන නිපදවීමට අවසර දෙමින් අධිකරණය දේශීය කර්මාන්ත ශාලාවේ පැවැත්ම සුරක්ෂිත කර තිබේ.

ආහාර උපදේශක කමිටුවේ තීරණය පරිදි,අවුරුද්දකට වඩා අඩු ළදරුවන් සඳහා ලංකාවේ අලෙවි කරන කිරිපිටිවල හා ඒ ආශ්‍රිත නිෂ්පාදනවල මෙලමයින් කිසිසේත් අඩංගු නොවිය යුතු බවට හා ආනයනය කරනු ලබන එවැනි නිෂ්පාදන තහනම් කිරීමට සෞඛ්‍ය අමාත්‍යාංශය පියවර ගත්තේය. මේ අනුව 2010 මාර්තු 24 දින නිකුත්කරන ලද ගැසට් නිවේදනයට අනුව කිලෝග්‍රෑම් එකකට මිලිග්‍රෑම් 01කට වඩා අධික මෙලමයින් ප්‍රමාණයක් අන්තර්ගත කිරි හෝ කිරිපිටි නිෂ්පාදනයක් මෙරටට ආනයනය, නිෂ්පාදනය, ප්‍රවාහනය, බෙදාහැරීම, විකිණීම හා විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම තහනම් කරන ලදි. එසේම කිරි ආහාර ආනයනයේදී, මේ ප්‍රමාණය නොඉක්මවන බවට අදාළ රටේ පිළිගත් ආයතනයකින් සහතිකයක් තිබීමද අනිවාර්ය කර තිබේ.

## කිරි ආහාර හා සෞඛ්‍යය

DCD, වේ ප්‍රෝටීන හා මෙලමයින් සිදුවීම්වලින් පෙනෙන්නේ ආනයනික කිරි ආහාර මෙන්ම වෙනත් ආහාර ද්‍රව්‍ය සම්බන්ධව අපේඅවධානය ඉහළ නැංවිය යුතු බවය. විශේෂයෙන්ම ආනයනික කිරිපිටි හෝ කිරිපිටි ආශ්‍රිත වෙනත් නිෂ්පාදනයක හෝවෙනත් ආහාර ද්‍රව්‍යයක හෝ පෝෂණීය අගය නංවාලීමේ අරමුණින් එකතු කෙරෙන විවිධ රසායනික ද්‍රව්‍ය නිසා ශ්‍රී ලාංකික පාරිභෝගිකයන්ගේ සෞඛ්‍යය කෙරේ අහිතකර බලපෑම් ඇතිවිය හැකිද යන්න හඳුනාගැනීම හා කඩිනමින් අවශ්‍ය පියවර ගැනීම වැදගත්ය.

එසේම ජනතාවට මේ පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබාදිය හැකි හා අදාළ නිති රීති ක්‍රියාත්මක කිරීමේ බලය ඇති රාජ්‍ය නිලධාරීන් ස්වකීය වගකීම ඉටුකළ ආකාරය පිළිබඳව විමසා බැලිය යුතු වේ. මෙරට ආහාර පාලනය හා සම්බන්ධව මූලික වශයෙන් වැදගත් වන්නේ 1980 අංක 26 දරණ ආහාර පනත හා එහි නියෝග වේ. මෙහි අධිකාරි බලය ඇත්තේ, සෞඛ්‍ය අමාත්‍යාංශයට වන අතර පාරිභෝගික කටයුතු අධිකාරියටද ඊට අදාළ නීතිමය රාමුව යටතේ යම් යම් බලතල පැවරී ඇත. මේ අනුව ජනතාවට පෝෂණීය හා සෞඛ්‍යාරක්ෂිත ආකාරයෙන් ආහාරපාන සැපයීම හා ඒ පිළිබඳව මගපෙන්වීම සිදු කරන්නේ ප්‍රධාන වශයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය හා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය මගිනි.

ආහාර පනත හා එහි නියෝග පිළිබඳව සලකා බලන විට, ආහාර පාලනය පිළිබඳව සැලකිය යුතු නිති පද්ධතියක් මෙරට ඇති බව පෙනේ. එහෙත් පෙනෙන්ට ඇති ආකාරයට මෙහිදී සිදුව ඇත්තේ, නීති හා නියෝග නිසි ලෙස කඩිනමින් ක්‍රියාත්මක නොවීම බව පෙනේ. නිදසුනක් ලෙස ගතහොත් ඉහත සිදුවීම්වලදී සෞඛ්‍ය අමාත්‍යාංශය යම් ආකාරයක කල්මැරීමක් බවට චෝදනා එල්ල වී ඇත. අවශ්‍ය පියවර ගැනීමේදී ඇතිවූ ප්‍රමාදය පැහැදිලිව පෙනෙන්නකි. විශේෂයෙන් රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මේ පිළිබඳව යහපත් ස්ථාවරයක සිටියි. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මගින් නිකුත් කර ඇති නිවේදන මගින්ද පෙනේ.

### යහපත් ආහාර පාලනයක් සඳහා

මේ අනුව කිරි මෙන්ම සෙසු ආහාර පාලනය කිරීම සඳහා මෙන්ම ඒ යාන්ත්‍රණය නිසි ලෙස ක්‍රියාත්මක වීම සඳහා ගත යුතු තවත් පියවර ඇති බව පෙනේ. විශේෂයෙන් මේ සම්බන්ධව දිගුකාලීන වැඩසටහනක් අවශ්‍ය බව මේ අනුව පැහැදිලිය. මේ පිළිබඳව රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය විසින් දස වැදෑරුම් වැඩපිළිවෙලක් පසුගිය අගෝස්තු මාසයේදී ඉදිරිපත් කර තිබේ.

1. කිරිපිටි වෙනුවට දියර කිරි ප්‍රවර්ධනය කිරීම
2. සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් යුක්ත ආහාර අධිකාරිය ශක්තිමත් කිරීම
3. ආහාරවල ගුණාත්මක භාවය හා ආරක්ෂිත බව තහවුරු කිරීමේ ඒකකයක් පිහිටුවීම
4. මානව පෝෂණ විශේෂඥ සේවාවක් පිහිටුවීම
5. වෛද්‍ය විෂ සේවාවක් ස්ථාපිත කිරීම
6. ආහාර දැන්වීම් හා ප්‍රවර්ධනය හා සම්බන්ධ නීති හා නියෝග ශක්තිමත් කිරීම
7. ආහාර ආරක්ෂාව සම්බන්ධ විද්‍යාගාර පහසුකම් ප්‍රවර්ධනය කිරීම
8. බෝනොවන රෝග අසාමාන්‍ය ලෙස ව්‍යාප්ත වීම සම්බන්ධ හේතු සොයා බැලීමට පියවර ගැනීම
9. මව්කිරි දීම ප්‍රවර්ධනය කිරීම හා මව්කිරි කළමනාකරණ මධ්‍යස්ථාන පහසුකම් වර්ධනය
10. සෞඛ්‍යමත් හා ආරක්ෂිත ආහාර පිළිබඳ සංකල්පය

## එළකිරිවලගුණ-අගුණ

අලුත උපන් ළදරුවකුට මෙලොව ලබාදිය හැකි හොඳම කිරි මව්කිරි වේ. ඒ පිළිබඳව විවාදයක් නොමැත. උපතේ සිට මාස 06 දක්වා ළදරුවකුට වෙනත් කිසිදු ආහාරයකින් තොරව මව්කිරි පමණක් ලබාදීමට නිර්දේශ කරන්නේ ක්‍රමයෙන් වැඩෙන ළදරු ශරීරයට අත්‍යවශ්‍ය පෝෂණ සංඝටක සියල්ල එහි අඩංගුවන බැවිනි. එහෙත් යම් හේතුවක් නිසා ළදරුවකුට අවශ්‍ය මව් කිරි ලබාදීම මවටකළ නොහැකි නම්, (මව රෝගී වීම හෝළදරුවා මව් කිරි බීම ප්‍රතික්ෂේප කිරීම වැනි) එවැනි අවස්ථාවකදී ආදේශකය ලෙස ළදරු කිරිපිටි වර්ග භාවිත කළ හැකිය. ළදරු කිරි පිටි සියල්ලම පාහේ, දියර කිරි අනුසාරයෙන් සකස් කෙරෙන අතරඒවායේ සංයුතිය හැකිතාක් දුරට මව්කිරිවල සංයුතියට ආසන්නව තබා ගැනීමට අදාළ නිෂ්පාදන සමාගම් උත්සාහ දරයි. එහෙත් මව් කිරිවල පෝෂණ ගුණය අසමසම වන බැවින්, ළදරු කිරිපිටි කිසිසේත්ම මව්කිරිවලට සම කළ නොහැක.

කෙසේ වෙතත්, වැඩිහිටියන්ටත් වැදගත් වන පෝෂ්‍යදායී අතිරේක ආහාරයක් ලෙස එළකිරි හඳුන්වා දෙනු ලැබේ. එහෙත් කිරිවල ඇතුළත් ප්‍රෝටීන වැඩිහිටියන්ට ජීර්ණය කිරීම අපහසු වේ.

කිරිවල ඇතුළත් පෝෂක ප්‍රමාණය මෙසේය.

| | |
|---|---|
| ප්‍රෝටීන | 3% |
| කාබෝහයිඩ්‍රේට් | 5% |
| මේදය | 4% |
| ජලය | 87% |

මීට අමතරව කිරිවල කැල්සියම් හා විටමින ඇතුළත්ය.

කෙසේ වෙතත් මේ පෝෂක ප්‍රමාණය වෙනත් බොහෝ ආහාරයලින් ලබාගත හැකිය. නිදසුනක් ලෙස ගතහොත් වියළි හැල්මැස්සන්ගේ ඇතුළත්වන කැල්සියම් ප්‍රමාණය කිරිවලට වඩා බොහෝ සේ අධිකය. කොළ වර්ගවලද කැල්සියම් ඇතුළත්ය. ඒ අනුව සමබර ආහාර වේලක් මගින් කිරිවලින් ලැබෙන බොහෝ පෝෂක ලබාගත හැකි බව පෙනේ. කිරි අත්‍යශව්‍ය ආහාරයක් නොවන බව තීරණය කිරීම කළ හැකිය.

එහෙත් මේ වන විට කිරි අපේ ආහාර සංස්කෘතියේ හා ආහාර වර්ගවල කිරි සඳහා විශේෂ තැනක් අනාදිමත් කලක සිට පවතී. මෙරට ගවයින්ගෙන් ලබා ගන්නා කිරි යොදාගනිමින්, යෝගට්, පාස්ටරීකරණය කරන ලද කිරි, මුදවන ලද කිරි, බටර් වැනි විවිධ පරාසයක කිරි නිෂ්පාදන සාදනු ලැබේ. එසේම කිරි යොදාගනිමින් සකස්කරන ආහාර වර්ගද බොහෝ සේ තිබේ. මේ නිසාද කිරි ආහාර සඳහා අධික ඉල්ලුමක් දැකිය හැකිය.

වෛද්‍ය පර්යේෂණායතනයේ නිර්දේශය අනුව ඒක පුද්ගල කිරි අවශ්‍යතාවය වර්ෂයකට කිලෝග්‍රෑම් 60-65 පමණ බව විවිධ මූලාශ්‍රයවල සඳහන් වේ. කෙසේ වෙතත් මහ බැංකුවේ 2012 වාර්ෂික වාර්තාවේ ජාතික කිරි පරිභෝජන අවශ්‍යතාවය ගණනය කරනු ලබන්නේ දෛනික ඒක පුද්ගල පරිභෝජනය මිලිලීටර් 100ක් ලෙස සලකා බව පෙනේ.

### ආයුර්වේද මතය

ආයුර්වේදයේ විවිධ කිරි වර්ග සහ ඒවායේ ගුණ-අගුණ පිළිබඳව සඳහන් වේ. කිරි වර්ග අටක් පිළිබඳව ආයුර්වේදයේ සඳහන් වුවද ඉන් ප්‍රධානව භාවිතා වන්නේ එළකිරිය. එළකිරි අඩංගු කොට නිෂ්පාදනය කරන ඖෂධ රැසක් ආයුර්වේදයේ භාවිත වේ. එළකිරි පිළිබඳව සඳහන් වැදගත් කරුණු කිහිපයක් මෙසේය.

- එළ කිරි මෘදු ස්නිග්ධ ගුණයෙන් යුක්ත වන නිසා පෝෂණීය හා බලවර්ධක ආහාරයක් වේ.
- එළ කිරි යනු සීතල ගුණයෙන් යුතු බර ආහාරයකි. මේ නිසා එළකිරි නිතර පානය කිරීමෙන් සෙම ගතිය වැඩිවිය හැකිය. එලෙසම සෙම් රෝගීන්ටද කිරි අහිතකර විය හැකිය. එනිසා ඇදුම, පීනස, කුෂ්ට රෝග, අසාත්මිකතා වැනි රෝග සහිත අය එළකිරි පානය කිරීම එතරම් යෝග්‍ය නොවේ.

- එසේම ශරීර දුර්වලතාව, මන්දපෝෂණය, ශරීර දාහය, රත්පිත වැනි ඇතැම් රෝග පවත්නා අවස්ථාවලදී එළකිරි පරිභෝජනය කිරීම වැදගත් සේ සැලකේ.

එළකිරිවල දැකිය හැකි මේ පොදු ගුණ වෙනස්වීමට බලපාන සාධක කිහිපයක්ද හඳුනාගත හැකිය.

- දෙනුන්ගේ ආහාර සහ ජීවත්වන පාරිසරික තත්ත්වය
- කිරි දොවා ගන්නා වේලාව
- කිරි ලබා ගන්නා එළදෙනුන්ගේ ශරීර වර්ණය

එසේම, දීකිරි, මෝරු, ගිතෙල්, බටර්, චීස් ආදි එළකිරි වලින් තනනු ලබන සෙසු ආහාර වර්ගවල ගුණ මීට වඩා වෙනස් විය හැකිය.

එළවළු පමණක් ආහාරයට ගන්නා සහ සත්ත්ව මාංශ ආහාරයට නොගන්නා අයට අවශ්‍ය ප්‍රෝටීන ලබා ගත හැකි ආහාරයක් ලෙස එළකිරි වැදගත් වේ. එහිදී දියර කිරි මෙන්ම පස්ගෝරස යනුවෙන් හඳුන්වන අනෙකුත් කිරි ආහාරවලටද සමතැනක් ලැබිය යුතුය. විශේෂයෙන්ම මුදවා ගත් කිරි ආහාරයට එක් කර ගැනීම එහි පෝෂණ ගුණය හොඳින් ලබා ගැනීමේ එක ක්‍රමයකි.

කෙසේ වෙතත්, දිනපතා එළකිරි පානය කිරීම වැඩිහිටියන්ට අත්‍යවශ්‍ය බවක් ආයුර්වේදයේ සඳහන් නොවේ.

කිරිපිටි නිපදවීමේදී යොදා ගනු ලබන ක්‍රමවේදය නිසා එහි නිසි ගුණය අඩංගු නොවේ. එනිසා ස්වාභාවික දියර කිරි සහ පිටි කිරි කිසිසේත් සමාන නොවේ. ස්වාභාවික කිරි වල අඩංගු සියලූ දේ පිටි කිරිවල අඩංගු නොවේ. එසේම ස්වාභාවික අඩංගු නොවන බොහෝ දේ පිටිකිරිවල අඩංගු වේ. එපමණක් නොව ගොවිපොළ සතුන්ගේ ආහාර සහ පාරිසරික තත්ත්ව මත එම කිරිවල ගුණ සම්බන්ධයෙන් නිශ්චිත හා නිසැක සහතිකයක් දීමද උගහටය. ගමේ ගොඩේ හැදුණු වැඩුණු එහිම තණකොළ උලාකන දෙනුන් ගේ කිරි නම් ස්වාභාවික ගුණ සහිත බව නිසැකවම කිව හැකිය.

## ශ්‍රී ලංකාවේ කිරි භාවිතය හා නිෂ්පාදනය

එළකිරි යනු අත්‍යවශ්‍ය ආහාරයක් නොවන නමුත් මෙරට ජනතාවගේ කිරි අවශ්‍යතාවය සම්පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය කිරි ආහාර පිටරටවලින් ආනයනය කිරීම මෙන්ම මෙරට ඇතුළත නිෂ්පාදනය කිරීමද දැකිය හැකිය.

ශ්‍රී ලංකා වෛද්‍ය පර්යේෂණායතනය මගින් නිර්දේශිත ඒක පුද්ගල කිරි පරිභෝජනය වන්නේ වර්ෂයකට කිරි කිලෝග්‍රෑම් 60-65 අතර ප්‍රමාණයකි.

2012 වසරේදී සමස්ත ජාතික කිරි පරිභෝජන අවශ්‍යතාවයෙන් සමස්ත දේශීය කිරි නිෂ්පාදනයෙන් 40%ක් පමණ ප්‍රමාණයක් සපයාදී ඇති බව පෙනේ. ඉන් 2012 වසර ඇතුළතදී ආනයනය කරන ලද කිරිපිටි ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 79.4 දක්වා ප්‍රතිශතයක් වශයෙන් 5.5% කින් පහළ වැටීමට පාදක විය.

ඉහත කී ඒක පුද්ගල කිරි පරිභෝජනය පදනම් කරගනිමින් 2016 වර්ෂය වන විට දේශීයව නිෂ්පාදිත කිරිවලින් රට ස්වයංපෝෂිත කිරීමට නම් දැනට ලීටර් මිලියන 258ක් පමණ වන දේශීය එළකිරි නිෂ්පාදනය ලීටර් මිලියන 732ක් දක්වා ඉහළ නැංවිය යුතු වේ.

### ශ්‍රී ලංකාවේ කිරි ආහාර ආනයනය

ශ්‍රී ලංකාවේ කිරි අවශ්‍යතාවයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් විදේශීය රටවලින් ආනයනය කරනු ලැබේ. කිරි පිළිබඳව ඇති වී තිබෙන ගැටලු අතරින් වැඩි ප්‍රමාණයක් ඇති වී තිබෙන්නේ ආනයනික කිරිපිටි නිසා බව පැහැදිලිය. පිටරටවලින් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන ආහාරපාන අතුරින් වැඩිම මුදලක් වැය කරනු ලබන නිෂ්පාදන අතර කිරි පිටි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන තිබේ. මෑත කාලයේදී කිරි ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කිරීම සඳහා වැය කර ඇති මුදල හා එය සමස්ත ආනයන වියදමෙන් කෙතරම් ප්‍රතිශතයක්ද යන්න 2 වගුවේ දැක්වේ.

| වර්ෂය | ආනයන වියදම (රු. මිලියන) | සමස්ත ආනයන වියදමේ ප්‍රතිශතය |
|---|---|---|
| 2008 | 31,221 | 2.0% |
| 2009 | 18,948 | 1.6% |
| 2010 | 29,214 | 1.9% |
| 2011 | 38,182 | 1.7% |
| 2012 | 39,023 | 1.6% |

**2 වගුව: ශ්‍රී ලංකාවේ කිරි ආනයන දත්ත**
(මූලාශ්‍රය: වාර්ෂික වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුව)

ආනයනික කිරිපිටිවල පවත්නා ගුණාත්මක තත්ත්වය පිළිබඳගැටලු හැරුණු විට කිරිපිටි මිල නිතර ඉහළ යාමද පාරිභෝගිකයන්ට පීඩාවක් වේ. ලෝක වෙළෙඳපොළේ කිරිපිටි මිල ඉහළ යන අවස්ථාවලදී ඒ බව දක්වමින් කිරිපිටි මිල වැඩිකිරීමට ඉල්ලීම් කිරීම කිරිපිටි සමාගම් සිදුකරයි.

අනෙක් අතට ගුණාත්මකභාවයෙන් හා සදාචාරාත්මකභාවයෙන් තොර කිරිපිටි වෙළෙඳ දැන්වීම්වලට කිරිපිටි සමාගම් වාර්ෂිකව වැය කරන අතිවිශාල මුදලක් වූ (රුපියල් මිලියන 5000 කට වඩා වැඩි) ප්‍රචාරක පිරිවැය නොවේ නම්, කිරිපිටි කිලෝවක් දැනට පවත්නා මිලට වඩා අඩු සාධාරණ මිලකට පාරිභෝගිකයාට සැපයීමටද හැකියාව ලැබිය යුතුය.

ගුණාත්මක වශයෙන් හා වෛද්‍ය විද්‍යාත්මක වශයෙන් මෙතරම් පිටිකිරි සම්බන්ධ ගැටලු මතුව තිබියදීත් කිරිපිටි ආනයනය ඉහළ යන්නේ දේශීය කිරි නිෂ්පාදනය ප්‍රමාණවත් නොවීම නිසාය. ආනයනික කිරිපිටි සීමා කෙරෙන්නේ නම් එම හිඩැස පුරවාලීම සඳහා පාරිභෝගිකයන් වෙත දියර කිරි හෝ දේශීය පිටිකිරි ලබාදීමට හැකි වීම අවශ්‍යය.

2012 වන විට ශ්‍රී ලංකාවේ එළගවයින් 1,200,000ක් පමණ සිටියද, කුඩා හා මහා පරිමාණ කිරි ගොවිපොළ 196,000ක් පමණද පැවතියද, විධිමත් සැලැස්මක් සහිතව මේ කටයුතු නියාමනය නොවීම නිසා, පසුගිය දශක තුනක පමණ කාලයේදී දේශීය කිරි කර්මාන්තය යම් බිඳ වැටීමකට ලක්වී ඇත. 1978 වර්ෂය වන විට රටට අවශ්‍ය කිරි ප්‍රමාණයෙන් 80%ක් පමණ මේ රටේ නිෂ්පාදනය කරන ලද නමුත්, අද වන විට ඒ ප්‍රමාණය පවතින්නේ 40%පමණ මට්ටමකය. එහෙත් ඒ මෑත කාලයේදී ඇති වූ වර්ධනයක් හා සමඟිනි.

මෙහිදී දේශීය කිරි නිෂ්පාදනය දියුණු කිරීමෙන් ගම්බද ජනතාවගේ ආර්ථික තත්ත්වය වර්ධනය වන අතර ආනයනික කිරිපිටි සඳහා වාර්ෂිකව පිටරටට ඇදීයන අතිවිශාල ධනස්කන්ධයද අප රට ඇතුළත රඳවාගැනීමටද හැකිවනු ඇත. එසේම ඉන් මතු වන 'සිය රට දේ සිරි සැප දේ' යන දේශීය චින්තනය පාදක කරගත් සුභවාදී ආකල්පවලින් ජනතාව පරිපූර්ණ වීමද සිදු වනු ඇත.

## දේශීයකිරි නිෂ්පාදනයේ වර්ධනය

ආනයනික කිරිපිටි හා ඒ ආශ්‍රිත නිශ්පාදන ගෙන්වීම වෙනුවට දේශීය කිරි නිශ්පාදනය යෝග්‍ය විසඳුමක් වන බව පැහැදිලිය. එසේම මහින්ද චින්තනය යටතේ දියර කිරි ප්‍රවර්ධනය කිරීම ජාතික ප්‍රතිපත්තියක් සේ පිළිගෙන තිබේ.

දේශීය කිරිගව නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලසුම් සහගත ප්‍රයත්නයක් රජයමෑත කාලයේදී ගෙන ඇති අතර ඒ නිසා දේශීය කිරි නිශ්පාදනයේ ඉහළ යන ප්‍රවණතාවයක් මෑත කාලයේදී දැකිය හැකිය. වර්තමාන රජය බලයට පත් 2005 වසරේ සිට මේ දක්වා ගත වූ කාලය ඇතුළත දේශීය කිරි නිෂ්පාදනයේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට තිබේ. මහ බැංකු වාර්තා ආශ්‍රයෙන් සකස් කරන ලද 3 වගුවෙන් එය පැහැදිලිව දක්වේ.

**3 වගුවඃ පශු සම්පත් (කිරි ගව) අංශය පිළිබඳ සංඛ්‍යා**

| | | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|---|---|
| 1 | ජාතික ගවයන් සංඛ්‍යාව (මිලියන) | 1.5 | 1.5 | 1.5 | 1.6 | 1.6 | 1.6 |
| | එළගවයින් | 1.2 | 1.2 | 1.1 | 1.2 | 1.2 | 1.2 |
| | මීගවයින් | 0.3 | 0.3 | 0.4 | 0.4 | 0.4 | 0.4 |
| 2 | ජාතික කිරි නිශ්පාදනය (ලීටර් මිලියන) | 202.0 | 208.1 | 233.4 | 247.6 | 258.3 | 299.3 |
| | එළකිරි | 169.7 | 172.4 | 184.1 | 191.9 | 203.5 | 237.6 |
| | මීකිරි | 32.3 | 35.7 | 49.3 | 55.6 | 54.8 | 61.6 |
| 3 | කිරි ආහාර නිෂ්පාදනය (ලීටර් මිලියන) | 12.1 | 13.5 | 25.3 | 17.8 | 21.4 | 29.3 |
| 4 | එළකිරි නිෂ්පාදන මිල (ලීටරයක් රුපියල්) | 21.00 | 29.53 | 29.53 | 32.48 | 50.00 | 50.00 |

මූලාශ්‍රයඃ වාර්ෂික වාර්තා, ශ්‍රී ලංකා මහ බැංකුව

මෙරට දේශීය වශයෙන් කිරි නිෂ්පාදනයේ යෙදෙන මහා පරිමාණ සමාගම් අතර රජයට අයත් සමාගමක් වන මිල්කෝ සමාගම පුඛත්වයක් ගනියි. කිරි ආශ්‍රිත ආහාර රැසක් නිපදවන මිල්කෝ සමාගමේ නිෂ්පාදනය මෑත කාලයේදී ඉහළ ගොස් ඇති අතර ඉදිරි මාස දහඅටක කාලය ඇතුළත ස්වකීය නිෂ්පාදනය දෙගුණයක් කිරීමටද ඔවුන් අපේක්ෂා කරයි.

පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයට අනුව ශ්‍රී ලංකාවේ දෛනිකව නිෂ්පාදනය කරනු ලබන කිරි ප්‍රමාණය ලීටර් 800,000ක් පමණ වේ. මේ ප්‍රමාණයෙන් 500,000ක් පමණ සමාගම් තුනක් මගින් මිලදී ගැනේ. ඒ මිල්කෝ (ලීටර් 210,000), නෙස්ලේ (ලීටර් 160,000), පැල්වත්ත (ලීටර් 130,000) වශයෙනි. මේ අතර කොත්මලේ (ලීටර් 40,000), අඹේවෙල (ලීටර් 30,000), ලකී යෝගට් (ලීටර් 18,000)හා රිච්ලයිෆ් (ලීටර් 11,000) යන සමාගම්ද කිරි මිලදී ගන්නා අතර මේ සියලු සමාගම් විවිධ කිරි ආහාර රැසක් නිෂ්පාදනය කරයි.මේ ඉතිරි කිරි ප්‍රමාණය බොහෝ දුරට පුද්ගලික පරිභෝජනයට හා ඍජුව පාරිභෝගිකයාට සපයන කිරි ගොවීන්ගේ නිෂ්පාදන වේ.

මෑත කාලයේදී දේශීය කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන වර්ධනය සඳහා හේතු වී ඇති හේතු මෙසේය.

1. **කිරි සඳහා ලබාදෙන මිල ඉහළ නැංවීම**-2010 වර්ෂය වන විටද කිරි ලීටරයක් සඳහා ගොවියාට ලැබුනේ රු. 32.80ක් පමණි. එහෙත් කිරි ලීටරයක නිෂ්පාදන පිරිවැය රු. 27.86ක් පමණ විය. කිරි ලීටරයක් සඳහා ගෙවනු ලබන සම්මත මිල රු. 50ක් දක්වා 2011 වර්ෂයේදී ඉහළ නැංවීම කිරි ගොවීන් තවදුරටත් කිරි නිෂ්පාදනය වෙත යොමුවීමට පොළඹවන්නකි.

2. **කිරි ගවයින් සංඛ්‍යාව වර්ධනය කිරීමට පියවර ගැනීම** - ජාතික පශු සම්පත් මණ්ඩලයේ කිරි ගොවිපොළවල නිෂ්පාදනය මෑත කාලයේදී ඉහළ යැමට හේතුව ආනයනික කිරි ගවයින්ගේ ඉහළ ඵලදායිතාවයයි.
3. **කිරි ගව පාලනය සඳහා ලබාදී ඇති සහන හා ණය යෝජනා ක්‍රම** - සුළු පරිමාණ කිරි ගොවින් හා මහා පරිමාණ ව්‍යවසායකයන් සඳහා වාණිජ බැංකු මගින් විවිධ ණය යෝජනාක්‍රම හඳුන්වාදී තිබේ. කිරි ගවයන් මිලදී ගැනීම, ගවගාල් තැනීම වැනි කාර්ය සඳහා මෙ මගින් ණය මුදල්ප්‍රදානය කෙරෙන අතර දනට අනුමැතියට යොමු කර ඇති නවතම කිරි ගව සංවර්ධන ණය යෝජනා ක්‍රමය මහා පරිමාණ ව්‍යවසායකයින්ට වඩාත් විපුල ප්‍රතිලාභ අත්කර දෙනු ඇත.
4. **උතුරු හා නැගෙනහිර පළාත්වල දායකත්වය වැඩිවීම හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම** - අතීතයේ කිරි නිෂ්පාදනය සඳහා වැදගත් වූ උතුරු හා නැගෙනහිර පළාත්වල කිරි නිෂ්පාදනය දශක තුනකට අධික කාලයක් පැවැති ත්‍රස්ත ගැටුම් නිසා අඩාල වී තිබිණි. එහෙත් 2009 වර්ෂයෙන් පසු, ඒ ප්‍රදේශවල ගව පට්ටි පාලනය හා කිරි නිෂ්පාදනය ක්‍රමයෙන් ඉහළ යමින් පවතී. මේ සඳහා රජයේ දායකත්වයද ලැබීම නිසා මේ ප්‍රගතියට හේතුවකි.
5. **දේශීය කිරිපිටි නිෂ්පාදන කර්මාන්තයට ලබාදී ඇති බදු සහන** - පවත්නා බදු ව්‍යුහය ඇතුළත කර්මාන්තයක් වශයෙන් කිරිපිටි නිෂ්පාදන කර්මාන්තය සැලකීමේ දී වසර 05ක බදු සහන කාලයක් හා ඉක්බිති 12% සහන බදු අනුපාතයක් ලබාදේ.

## දේශීය කිරි නිෂ්පාදනයේ අඛණ්ඩ වර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය කරුණු

පශු සම්පත්හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය 2011 වසරේදී ප්‍රකාශයට පත් කළ මූලික පශු සම්පත් සැලසුමේ සඳහන් පරිදි, 2016 වසර අවසාන වන විට කිරිවලින් රට ස්වයංපෝෂිත වීම සඳහා ඉලක්කයක් ප්‍රකාශයට පත්කර ඇත. මේ වන විට සැපයෙන්නේ දේශීය කිරි අවශ්‍යතාවයෙන් 40%ක් පමණක් නම්, කිරිවලින් ස්වයංපෝෂිතභාවය අත්පත් කරගැනීම සඳහා තව දුර යා යුතු බව පැහැදිලිය.

දේශීය කිරි නිෂ්පාදනය අඛණ්ඩව දිරි ගැන්වීමෙහිලා වැදගත්වන ප්‍රධාන කිහිපයක් හඳුනා ගත හැකිය.

1. **අභිජනනය කරන ලද උසස් කිරි ගවයින් ලබාදීම**- පවතින ජාන සම්පත්වල දුර්වල උපයෝජනය නිසා ගවයින්ගේ අඩු ඵලදායිතාවක් තිබීමට හේතුවකි. මේ නිසා අභිජනනය කරන ලද උසස් කිරි ගවයින් ලබාදීම අවශ්‍ය වනඅතර, මේ ගවයින් දේශීය කාලගුණයට හා පරිසරයට උචිත සතුන් වීමද බෙහෙවින් වැදගත්ය. ජර්සි, ෆ්‍රීසියන් වැනි ගව වර්ගවලට වඩා, ඉන්දීය ප්‍රභවයකින් යුතු සින්ධි, සහීවාල් වැනි ගව වර්ග මෙහිලා වඩාත් ඵලදායී විය හැකිය. තවද, දේශීය බටු ගව වර්ග කෘත්‍රිම සිංචනයට ලක් කිරීමෙන්ද ඵලදායි සාර්ථක නෙලා ගත හැකිය.
2. **කිරි ගවයින් සඳහා ප්‍රමාණවත් තෘණ භූමි ඇති කිරීම**- කිරි ආහාර නිෂ්පාදනය පුළුල්ව සිදුකරන ප්‍රදේශවල තෘණ භූමිවල අවශ්‍යතාවය වඩාත් බරපතළ වේ. ප්‍රමාණවත් තරම් තණ බිම් නොමැති වීම නිසා ගවයන් ආරක්ෂිත ප්‍රදේශවලට වෙත යොමු කිරීමට ගවහිමියන් කටයුතු කරන අතර එය පාරිසරික ගැටලුවලටද හේතු වී තිබේ.
3. **නිලධාරි හිඟයඅවසන් කිරීම** - කිරි ගොවීන්ට අවශ්‍ය සේවා සපයන රජයේ නිලධාරීන් වන්නේ සත්ත්ව සංවර්ධන නිලධාරීන් හා පශු වෛද්‍යවරුන්ය. පශු වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව මේ වන විට 617 දක්වා වර්ධනය වී ඇතත්, සත්ත්ව සංවර්ධන නිලධාරීන්ගේ ගණන 1978 වසරේසිට මේ දක්වා කාලය ඇතුළත 816 දෙනකුගේ සිට 516ක් දක්වා අඩු වී තිබේ.
4. **අත්‍යවශ්‍ය සහන සැපයීම** - ගවයින්ට ප්‍රතිකාර ලබා දීම, කෘතිම සිංචනය ආදි කටයුතු කිරීමේදී කිරි ගොවීන්ට සැලකිය යුතු මුදලක් වැය කිරීමට සිදුව ඇත. මේ නිසාගොවීන්ට අවශ්‍ය සහන ණය පහසුකම් සැලසීම කළ යුතුවේ. පසුගිය වර්ෂයේදී ක්‍රියාත්මක කළ සහන මිලට කිරි හරකුන් සහා ඝන ආහාර හා ඛනිජ ලවන ලබා දීමේ වැඩපිළිවෙල හා කිරි ගව රක්ෂණය යළි ඇරඹීමද කාලීන අවශ්‍යතාවයක් බවට පත්ව තිබේ.

5. **කිරි රැස්කිරීමේ ඇති ගැටලුවිසඳීම** - ග්‍රාමීයව නිෂ්පාදනය වන දියර කිරි එක් රැස්කිරීම සඳහා දීපව්‍යාප්ත ජාතික වැඩපිළිවෙලක් ක්‍රියාත්මක නොවේ. මිල්කෝ, නෙස්ලේ වැනි පෞද්ගලික සමාගම් විසින් දියර කිරි එක් රැස් කරන මධ්‍යස්ථාන අරඹා ඇතත් ඉන් රටේ කිරි නිෂ්පාදනය කරන සියලු ප්‍රදේශ ආවරණය නොවේ.

6. **දියර කිරි බෙදාහැරීමේ විධිමත් වැඩපිළිවෙලක් සැකසීම** - දියර කිරි පානය සඳහා කැමත්ත දක්වන පාරිභෝගිකයන්ට දියර කිරිලබා ගැනීමේ පහසුකම් කඩිනමින් සැලසිය යුතුය. මෙහිදී රජයේ, රජයට අනුබද්ධ හා පෞද්ගලික ආයතනවලට විශාල දායකත්වයක් ලබාදිය හැකිය. දියර කිරි පානය කිරීම උදෑසන සිදුවන ක්‍රියාවලියක් වන බැවින් පිරිසිදුව හා කාර්යක්ෂමව දියර කිරි බොදාහැරීමේ කාර්යය සංවිධානය කළ යුතුය. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය මෙවැනි උත්සාහයක් මේ වසරේ සැප්තැම්බර් මුල් සතියේ සිට ආරම්භ කළේය.

## කිරි නිෂ්පාදනය පිළිබඳ රාජ්‍ය අංශයේ වගකීම

දේශීය කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීමෙහිලා ප්‍රධාන වගකීම් භාරය උසුලන්නේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍යය දෙපාර්තමේන්තුවයි. මෙහි අභ්‍යන්තර ක්‍රියාපටිපාටිය වඩා විධිමත් කිරීමෙන් ඵලදායී කිරි දෙනුන් වැඩි සංඛ්‍යාවක් බිහි කරගත හැකි අතර, එය කිරි නිෂ්පාදනය වර්ධනය කිරීමේදීවඩාත් ප්‍රතිඵලදායක වේ. ආනයනික කිරි පිටිවලින් අයකරන බදු පදනම් කරගනිමින් තීරණ ගැනීමට වඩා, සැබැවින්ම දේශීය කිරි කර්මාන්තය නැංවීමෙහිලා ඉහත කී පරිදි දෙපාර්තමේන්තු ක්‍රියා පටිපාටිය පුළුල් කිරීමෙන් විපුල පල නෙලා ගත හැකිය.

මෙහිලා පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු වේ.

1. කෘතිම සිංචනයේ සාර්ථකත්වය සඳහා අදාළ ක්‍රියාපටිපාටිය නිසි ලෙස අනුගමනය කිරීම සිදු කළ යුතුය. කෘත්‍රිම සිංචනයෙන් පසු ගැබ් පරීක්ෂණය අනිවාර්යයෙන් සිදුකිරීම හා ගැබ් ගෙන නොමැති සතුන් හඳුනාගෙන ඉන්පසු යත යුතු අවශ්‍ය පියවර ගැනීම වැදගත්ය. තුන්වැනි වරටද කෘතිම සිංචනය සිදුකර ඉක්බිති ගැබ් නොගත් සතුන් ඉවත් කළ යුතුය.
2. කෘත්‍රිම සිංචනයේදී ගැහැණු සතුන් පමණක් බිහි කෙරෙන sexed semen ක්‍රමය දිවයින පුරා ක්‍රියාත්මක කළ යුතුය. කෘත්‍රිම සිංචනයෙන් ඇතැම් විට උපදින පිරිමි පැටවුන් රැකබලා ගැනීමට ග්‍රාමීය කිරි ගොවියාට සිදුවී තිබේ. ප්‍රාණ ඝාතනය නොකරන බෞද්ධ ගැමියන් කිරි ගව පාලනයෙන් දුරස්වීමට මෙයද හේතුවකි.
3. ගොවිපොළ සැලසුම්කරණය අනුව, සතුන්ගෙන් අඛණ්ඩව කිරි ලබාගැනීමේ පදනමක් මත කෘත්‍රිම සිංචනයෙන් දෙනුන් ගැබ් ගැන්වීම කළ යුතුය. ආර්ථික වශයෙන් ඵලදායී සතුන් පමණක් ගොවිපොළේ රඳවාගෙන, සෙසු සතුන් ඉවත් කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමද වැදගත්ය.
4. තෘණ වගාව සඳහා කිරි ගොවියාට ප්‍රමාණවත් මූල්‍යාධාරයක් ලබාගත හැකි ක්‍රමයක් සකස් කළ යුතුය. දැනට අනුමත දීමනාව පළාත් වශයෙන් වෙනස් වේ. අවම වශයෙන් අක්කරයකට රු. 30,000/=ක් පමණ ලබාදීම වැදගත්ය. තේ, පොල්, රබර් වගාව මෙවැනි ආධාර ක්‍රම ක්‍රියාත්මක වේ.
5. කිරිගව පාලනයේදී අවශ්‍ය වන ඖෂධ, විටමින් සහ ඛනිජ ලවණ ආදිය ඒවා නිෂ්පාදනය කරන රටවලින් ආනයනය කර, සහනදායී මිල ක්‍රමයකට පශු වෛද්‍ය කාර්යාල හරහා කිරි ගොවියාට ලබාදීම වැදගත්ය.
6. පෙරවරුවේ මෙන්ම පස්වරුවේද කිරි දොවා ගැනීමට ක්‍රමයක් සකස් කළ යුතු අතර, (උදයේ ලීටර් 10 නම් සවස ලීටර් 5 පමණ ආදි ලෙස) මෙහිදී සවස දොවන කිරි කල් තබාගැනීම සඳහා එකතු කිරීමේ මධ්‍යස්ථාන වෙත කල්තබා ගැනීමේ ටැංකි (cooling tanks) ලබාදීම කළ යුතු වේ.
7. ඒ ඒ ප්‍රදේශවල නිපදවනු ලබන කිරි, ඒ ඒ ප්‍රදේශ ඇතුළතම අලෙවි කරන ක්‍රමවේදයක් සකස් කළ යුතු අතර, මෙහිදී කිරි ආශ්‍රිත නිෂ්පාදිතවල පිරිවැය අඩුවීමේ වාසිය පාරිභෝගිකයාට ලැබිය යුතුය.
8. කල්කිරි, යෝගට්, පැස්ටරීකරණය කළ කිරි හා ශීත කළ කිරි වැනි කිරි ආශ්‍රිත සෙසු නිෂ්පාදන ප්‍රාදේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂිත ව්‍යවසායක පන්තියක් (මහා පරිමාණ සමාගම් හැර) බිහි කළ යුතුය. මෙහිදී සහනදායී පොලී මත ලබාදෙන ණය මාර්ගයෙන් ඔවුන් දිරිගැන්විය හැකිය. එසේම මේ සඳහා කිරිගොවි සමූපකාර සමිතිවල හැකියාව වර්ධනය කිරීමද යෝග්‍ය වේ.

9. වියපත් දෙනුන් හා පැටව් වරන දෙනුන් නඩත්තු කිරීම කිරි ගොවියාට ආර්ථික වශයෙන් එලදායී නොවේ. එවැනි දෙනුන් රැඳවීම සඳහා රජය මගින් රැඳවීමේ මධ්‍යස්ථාන පිහිටුවීම සිදු කළ හැකිය.
10. ග්‍රාමීය ගොවියන්ගෙන් හා කිරි ගොවිපොළවලින් බැහැර කරනු ලබන ගොම යොදාගනිමින් ජීව වායුව හා කාබනික පොහොර නිෂ්පාදනය කිරීම දිරිගන්වන ක්‍රමවේදයක් සකස් කළ යුතුය. එමගින් කිරි ගොවියාට අතිරේක ආදායමක් හෝ මුදල් ඉතිරියක් හෝ ලබාගත හැකිය.
11. කිරි නිෂ්පාදනය සඳහා රජයේ ප්‍රධාන දායකත්වය ලබා දෙන්නේ සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවයි. එයට සෘජුවම අයත් වන්නේ ගව, ඌරු, එළු, බැටළු, කුකුල් වැනි කෘෂිකාර්මික සතුන්ය. එහෙත් මේ දෙපාර්තමේන්තුවේ කාර්යාල රැසක ප්‍රධාන කාර්යය බල්ලන්ට ප්‍රතිකාර ලබාදීම වී ඇත. මහජන මුදල් අපතේ යවන මේ ක්‍රමය වහා වෙනස් කළ යුතු අතර, දවසේ ඕනෑම වේලාවක ඉහළම ප්‍රමුඛත්වය කෘෂිකාර්මික සතුන්ට ලබාදියයුතුය.
12. සිය කාලය, ශ්‍රමය හා ධනය යොදා ගනිමින් කිරි කර්මාන්තය කරගෙන යනු ලබන ගොවීන් හඳුනාගෙන, ඔවුන්ට ඇගැයීමක් හා ප්‍රමුඛත්වයක් ලබාදී ඔවුන් දිරිමත් කිරීමද කළ යුතු වේ.



## කිරිගොවීන්ගේ වගකීම්

1. කිරි ගොවීන් තම ප්‍රදේශයේ සත්ව සංවර්ධන සහකාර හා පශු වෛද්‍ය නිලධාරීන් නිරන්තරව ඇසුරු කළ යුතු අතර, ඔවුන්ගේ උපදෙස් නිතර ලබා ගත යුතුය. අවශ්‍ය දැනුම, පුහුණුව නිතර ලබාගත යුතුය.
2. තමන්ගේ ගවයින්ගේ පිළිබඳව අඩුපාඩු හා දුර්වලතා නිලධාරීන් හට දැන්විය යුතු අතර, තම සතුන් පිළිබඳව අධි තක්සේරුවකට නොඑළඹිය යුතුය.
3. තමා සතු කිරි දෙනුන් පිළිබඳව දෛනික වාර්තා තබාගැනීම පිළිබඳව ගොවීන් උනන්දු විය යුතුය. එහිදී තම සතුන් පිළිබඳව නිවැරදි අවබෝධයක් හා තක්සේරුවක් ලබාගැනීමට හැකිය. දැනට දෛනික වාර්තා තැබීම සිදුවන්නේ ප්‍රධාන කිරි ගොවිපොළවල පමණි.
4. කිරි නිෂ්පාදනය වැඩි කිරීම, නිෂ්පාදන පිරිවැය අඩු කිරීම වැනි කරුණුවලදී ගොවි මහතුන් සතුව යම් ඉලක්කයක්තිබිය යුතු අතර, එම ඉලක්කය කරා කැපවීමෙන් ළඟා විය යුතුය.
5. තම නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම දියර කිරි වශයෙන් පමණක් අලෙවි කිරීමෙන් වැලකී, එකතු කළ අගය (Added value)සහිත නිෂ්පාදන ලෙස වෙළෙඳපොළට යොමු කිරීමෙන් වැඩි ලාභයක් ලැබීමට ගොවියා යොමු විය යුතුය. (උදා: දියර කිරි නොව මුදවාගත් කිරි ලෙස හෝ යෝගට් ලෙස)

## කිරි ආහාර පිළිබඳ වෙළඳ ප්‍රචාරණය හා එය නියාමනය කිරීම

කිරි හා කිරිපිටි අත්‍යවශ්‍ය ආහාරයක්ය යන මතය මෙරටේ ජනතාව අතර ඇති කර තිබෙන්නේ ප්‍රධාන වශයෙන් ජනමාධ්‍ය ඔස්සේ සිදුකරන ප්‍රචාරණය මගිනි.

කිරි පිටි මෙරටට ආනයනය කරනු ලබන විවිධ බහුජාතික සමාගම්වල ප්‍රකට ප්‍රචාරක මාධ්‍යයක් වන්නේ විවිධ ජනමාධ්‍ය ඔස්සේ වෙළෙඳ දැන්වීම් පළකිරීමයි. විශේෂයෙන්ම ඒ හරහා ඔවුන් ඉලක්ක කරගන්නේ වැඩිවශයෙන් කාන්තාවන් හා කුඩා ළමුන්ය. මේ මගින් ඔවුන්ගේ පරමාර්ථ බොහෝදුරට 'මව හා දරුවා' යන උතුම් සංකල්පය ඔස්සේ ඉටුකර ගැනීමට හැකියාව ලැබී ඇත. මේ ප්‍රචාරණ මාධ්‍ය ඔස්සේ දැකිය හැකි දැන්වීම් අතර පහත සඳහන් ආකාරයේ දැන්වීම් සුලබය.

- දරුවන්ගේ වර්ධනය සඳහා යෝග්‍යබව සඳහන් කරන දැන්වීම් මෙරට ජනමාධ්‍යවල සුලභව දැකිය හැකි වේ.
- දරුවන්ගේ නිරෝගිබව පවත්වාගැනීමට හෝ විෂබීජවලින් ආරක්ෂාවීමට හැකි ආහාර වර්ග හුවාදක්වන දැන්වීම් නිතර දැකිය හැකිය.
- ඇතැම් රෝගාබාධ වළක්වාගැනීම සඳහා යම් යම් ආහාර පාන භාවිතය යෝග්‍ය බව පෙන්වාලන දැන්වීම් අපට දැකිය හැකිය.
- ඇතැම් ආහාර වර්ග නිර්දේශකර ඇත්තේ පිළිගත් වෘත්තික සංගම්වලිනි.
- ඇතැම් ආහාර වර්ග ප්‍රචාරණය සඳහා වෛද්‍ය වෘත්තිකයන් හෝ පෝෂණවේදීන් ලෙස රඟපාන පුද්ගලයන් යොදාගැනීම ඇතැම් දැන්වීම්වල අපට දැකිය හැකි කරුණකි.

පුවත්පත්, ගුවන්විදුලිය හා රූපවාහිනිය යන බහුවිධ මාධ්‍ය වලින් අද පාරිභෝගිකයින්ට වඩාත් සමීප හා ඉහළම බලපෑමක් සිදුකරන ජනමාධ්‍යය වී ඇත්තේ රූපවාහිනියයි. රූපවාහිනී දැන්වීම්කරණය හා ළමුන් ආහාර ඉල්ලුම අතර සම්බන්ධයක් ඇති බව පර්යේෂණාත්මකවද පෙන්වාදී තිබේ. එබැවින් රූපවාහිනී තිරයේ ඇතුළත් කිරිපිටි දැන්වීම් නිතර දකින දරුවා ඉල්ලා සිටින්නේ ඒවාමය. එහි ප්‍රතිඵලයක් වශයෙන් මව්වරුන්ද බොහෝ විට ඒවා ලබා දීමට උත්සාහ දරයි. දරුවකුට අවම වශයෙන් දිනපතා කිරි වීදුරු 3-4 ලබාදීමට පෙළැඹී සිටින අතර, මව්වරුන් සිතන්නේ සෑම විටම පැකැට්ටුවේ පිටුපස සඳහන් වන පෝෂ්‍ය පදාර්ථ තම දරුවන්ට ඒ මාර්ගයෙන් ලැබෙන බවය. නමුත් මෙහි සත්‍යය තත්ත්ව දන්නේ කිරිපිටි සමාගම් පමණකි.

රූපවාහිනී තිරයේ දකින මෙම දැන්වීම් සඳහා පෙනී සිටින දරුවන් දකින මව්වරුන් නිතර සිතන්නේ අදාළ කිරිපිටි මාර්ගයෙන් එම දරුවන් එකී පෝෂණ මට්ටමට ලඟා වී ඇති බවය. එබැවින් කෙසේ හෝ මෙම කිරිපිටි දරුවන් වෙත ලබාදීම මව්වරුන්ගේ අභිප්‍රායයි. සමාගම් පවසන්නේ මව්කිරි හා සමාන පෝෂණ ගුණයෙන් යුත් කිරිපිටි ඔවුන් නිපදවන බවය. වාසනාවකට මෙන් දරුවාට දිය යුතු හොඳම දේ මව්කිරිය යනුවෙන් අපේ සංස්කෘතියේ පවත්නා යහපත් ආකල්ප නිසා පිටිකිරි ඊට සමාන ආදේශකයක් සේ ව්‍යාප්ත නොවීය.

එසේම මෑත කාලයේදී කිරි පිළිබඳව ඇතිවූ ගැටලුවේදී අපේ රටේ ජනමාධ්‍ය ක්‍රියාකළ ආකාරය පිළිබඳව මදක් විමසා බැලිය යුතුය. විවිධ පාර්ශවවල අදහස් ඒ සැටියෙන්ම පුවත්පත්වල පළකරනු මිස ආනයනික කිරිපිටිවල අහිතකර භාවය පිළිබඳව පැහැදිලි ඍජු අදහසක් පළ නොකරන්නට සියලුම ජනමාධ්‍ය පාහේ ප්‍රවේශම්කාරී විය. ඊට බලපෑවේ කිරිපිටි වෙළෙඳ දැන්වීම් ඔස්සේ තම පුවත්පත්වලට ලැබෙන විශාල මුදල් සම්භාරය විය හැකිය.

## ආහාර සම්බන්ධ දැන්වීම් සම්බන්ධ පාලනය කරන නීති

ආහාර හා සම්බන්ධ දැන්වීම් පිළිබඳ පනවා ඇති නීති හා නියෝග ඇතත් ඒවා ශ්‍රී ලංකාවේ කෙතෙක් දුරට ක්‍රියාත්මක වන්නේද යන්න සැක සහිතය. වර්තමාන දැන්වීම් කලාවේදී උල්ලංඝනය කරනු ලබන එවැනි වැදගත් නියෝග දෙකක් පහත දැක්වේ.

- 1991 අංක 20 දරණ ආහාර (සංශෝධන) පනතින් සංශෝධිත 1980 අංක 26 දරණ ආහාර පනතේ 32 වගන්තිය යටතේ, ආහාර උපදේශක කමිටුවේ උපදෙස් මත සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලද(ලේබල් කිරීමේ හා ප්‍රචාරය කිරීමේ) නියෝගවල 9 වගන්තියට අනුව, කිසිදු ආහාරයක් ගිලනුන් සඳහා හිතකර බවට හෝ කවර හෝ රෝගයක් සුවකරන බවට හෝ රෝගයට සහනය ලබා දෙන බවට හෝ රෝගය වැලැක්වීමට හැකිවන බවට කෙරෙන කිසිදු ප්‍රකාශයක් ඍජුව හෝ වක්‍රව ප්‍රකාශ කිරීම නොකළ යුතුය.

- 1980 අංක 26 දරණ ආහාර පනතේ, (ලේබල් කිරීමේ හා ප්‍රචාරය කිරීමේ) නියෝගවල 13.9.ii වගන්තියට අනුව ප්‍රධාන ආහාර බලධාරියාගේ අනුමැතියක් නොමැතිව කිසියම් ආහාරයක් සම්බන්ධව වන ලේබලයක හෝ දැන්වීමක එය වෛද්‍ය වෘත්තිකයකු හෝ සංගමයක් විසින් හෝ යම් වෘත්තිකයකු විසින් නිර්දේශ කර ඇති බව දැක්වෙන වචන නොයෙදිය යුතුය. එසේම එවැනි ඇඟවීමක් කෙරෙන වචන උපක්‍රම හෝ පින්තූරමය වෙනත් ආකාරයක කිසිවක් නොයෙදිය යුතුය.

කෙසේ වෙතත් මේ නීති රීතිවලින් මිදී යමින් හෝ ඒවා නොතකා හරිමින් පාරිභෝගිකයා නොමඟ යවන අයුරින් කිරි හා කිරිපිටි ආශ්‍රිත වෙළෙඳ දැන්වීම් පළ කිරීමෙන් වඩාත්ම මුලාවට පත්වන්නේ කාන්තාවන් හා කුඩා ළමුන් බව පෙනී යයි. එබැවින් මේ පිළිබඳව සෞඛ්‍ය අමාත්‍යංශය හෝ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් හෝ නිවැරදි ක්‍රමවේදයක් හරහා මේ ප්‍රචාරවල සත්‍ය-අසත්‍යතාවය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ නිරන්තර සන්නිවේදන ක්‍රමයක් හා නියාමනය කිරීමේ වැඩපිළිවෙලක් ඇරඹීම කාලීන අවශ්‍යතාවයක් වී තිබේ.

### දැන්වීම්කරණය සඳහා ආචාරධර්ම

වෙනත් නීති තිබුණද ඒවා ක්‍රියාත්මක නොවන තත්ත්වයක් පැවතීම හා අදාළ බලධාරීන්ගේ ඇති උදාසීනත්වය හමුවේ දැන්වීම්කරණය සඳහා ආචාරධර්ම පද්ධතියක් හඳුන්වාදීම වැදගත් බව මේ කරුණු අනුව පැහැදිලිය.

එසේම දැන්වීම්කරණයේ යෙදෙන සමාගම් ස්වකීය සමාජමය වගකීම පිළිබඳව සිතිය යුතුය. විශේෂයෙන් වර්තමාන සමාජ තත්ත්වය හමුවේ එහි වැදගත්කම අපට අමතක කළ නොහැක. දැන්වීම්කරණයේ යෙදෙන පුද්ගලයින්ද මේ සමාජයේ වැසියන්මය.

දැන්වීම් පිළිබඳ ආචාරධර්ම පද්ධතියක් තිබීම ආහාර සම්බන්ධ කරුණුවලදී මෙන්ම වෙනත් බොහෝ නිෂ්පාදන සඳහා පොදු වන්නකි.



## ආශ්‍රිත ලිපි ලේඛන

- අල්විස්, ඒ.ඊ.එන්. හා තවත් අය, 2009, Analysis Of Factors Affecting Fresh Milk Consumption Among The Mid - Country Consumers, *Tropical Agriculture Research and Extension*, 12:2, 101-107.
- කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්තාව, 2013 ජුලි 26
- ඩූල්, ජී.ජේ. හා පරගහවැව යූ.එච්, 2010, System-level evaluation of dicyandiamide (DCD) for improved environmental outcomes on New Zealand dairy farms, *Food Security from Sustainable Agriculture*, New Zealand, 72, 67-70
- ඩී, එච්. ජේ., හා වෙනත් අය, A lysimeter study of nitrate leaching from grazed grassland as affected by a nitrification inhibitor, dicyandiamide, and relationships with ammonia oxidizing bacteria and archaea, 2009, *Soil Use and Management*, 25: 4, පිටු 454–461
- ප්‍රධාන ආහාර බලධාරියාගේ නියෝග, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ වෙබ් අඩවිය, (www.philk.org/Orders.htm)
- රජයේ වෛද්‍ය නිලධාරි සංගමයේ මාධ්‍ය නිවේදන - 2013 අගෝස්තු 05, සැප්තැම්බර් 3
- **ගැසට් නිවේදන**
  - අංක 1646/18 - 2010 මාර්තු 24, 2010 ආහාර (කිරි සහ කිරි නිෂ්පාදනවල අඩංගු මෙලමයින්) නියෝග
  - අංක 1376/09 - 2005 ජනවාරි 19, ආහාර (ලේබල් කිරීමේ හා ප්‍රචාරය කිරීමේ) නියෝග 2005

## පුවත්පත් වාර්තා

- **DCD (ඩයිසයනමයිඩ්) සිදුවීම**
  - ලංකාදීප - 2013 අගෝස්තු 04 හා 09
  - මව්බිම - 2013 මැයි 21 හා22
  - The Island - 2013අගෝස්තු 2
  - New Zealand Herald, 2013 ජනවාරි 25
  - The Sunday Times, 2013 ජනවාරි 25, අගෝස්තු 18
  - The Daily Mirror, 2013 ජනවාරි 25
  - The Daily News, 2013 අගෝස්තු 19, සැප්තැම්බර් 18
- **වේ ප්‍රෝටීන සිදුවීම**
  - රිවිර - අගෝස්තු 11,
  - දිනමිණ - අගෝස්තු 20,
- **මෙලමයින් සිදුවීම**
  - ඉරුදින - 2008 නොවැම්බර් 02
  - ලංකාදීප - 2008 නොවැම්බර් 07 හා 10
- **වෙනත් සිදුවීම්**
  - හරිත කලාපය 36

## වෙබ් අඩවි

- **වේ ප්‍රෝටීන සිදුවීම**
  - CNN වෙබ් අඩවිය - 2013 අගෝස්තු 5 (http://edition.cnn.com/2013/08/04/world/asia/china-botulism-milk-powder/index.html)
  - The Gurdian වෙබ් අඩවිය - 2013 අගෝස්තු 28 (www.theguardian.com/world/2013/aug/28/fonterra-milk-botulism-scare-false-alarm)
  - BBC වෙබ් අඩවිය - 2013 අගෝස්ත 28 (www.bbc.co.uk/news/business-23860452)
  - Milk food revolution against multinationals (http://www.ft.lk/2013/08/28/milk-food-revolution-against-multinationals)
- **මෙලමයින් සිදුවීම**
  - BBC වෙබ් අඩවිය - http://news.bbc.co.uk/2/hi/7720404.stm
  - Wikipediaවෙබ් අඩවිය http://en.wikipedia.org/wiki/2008_Chinese_milk_scandal
- සමරවීර ජී.ආර්.එස්.ආර්.සී හා සමන්ති, කේ.එල්.එක්,2010, Television Advertising And Food Demand Of Children In Sri Lanka: A Case Study From Galle District, ICBI 2010, University of Kelaniya, Sri Lanka
- පුවත් වෙබ් අඩවි
  - රොයිටර් පුවත්, 2013-08-05,Fonterra CEO apologizes, sees China dairy curbs lifted within days (www.reuters.com/article/2013/08/05/us-newzealand-milk-fonterra-idUSBRE97403U20130805)

**කිරිපිටි මිත්‍යාව, කිරි ආහාර සම්බන්ධ ගැටලු හා විසඳුමට මගක්**

2013 ඔක්තෝබර් 15

**ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය**

9, පළමු පටුමග, වනාත පාර, ගංගොඩවිල, නුගේගොඩ

www.gmsl.lk

**උපදේශකත්වය**

සුරන්ජන් කොඩිතුවක්කු

**පර්යේෂණය හා වාර්තා රචනය**

සරත් නුකුලසූරිය

ධනේෂ් විසුම්පෙරුම

ගයාන් ප්‍රදීප් විජේතුංග

**විශේෂ ස්තුතිය**

අමල් උඩවත්ත

වෛද්‍ය ඩැනිස්ටර් එල්. පෙරේරා

රන්ජන් කරුණානායක

හරිත ව්‍යාපාරයේ කාර්ය මණ්ඩලය

කසුන් ප්‍රියංකර

**මුද්‍රණය**

සියත්‍රා මීඩියා

**ශ්‍රී ලංකා හරිත ව්‍යාපාරය** (සංස්ථාපිත)
**இலங்கை பசுமை இயக்கம்** (கூட்டிணைக்கப்பட்டது)
The Green Movement of Sri Lanka Inc.

අංක 09, පළමු පටුමග, වනාත පාර, ගංගොඩවිල, නුගේගොඩ.
இல.09, முதலாவது ஒழுங்கை, வனாத்தை வீதி, கங்கொடவில, நுகேகொடை.
No 09, 1st Lane, Wanatha Rd, Gangodawila, Nugegoda, Sri Lanka.

**Tel:** + 94 - (0)11- 2817156 **Fax:** + 94 - (0)11 - 4805274 **Web:** www.gmsl.lk **E -Mail:** office@gmsl.lk